

ජාතික සමාජ සංවර්ධන ආයතනය
தேசிய சமூக அபிவிருத்தி நிறுவனம்
National Institute of Social Development

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை 2021
Annual Report

Ministry of Finance

State Ministry of Samurdhi, Household Economy, Micro-finance,
Self Employment and Business Development

ජාතික සමාජ සංවර්ධන ආයතනය

සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන
රාජ්‍ය අමාත්‍යාංශය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ උපාධි පිරිනමනු ලබන ආයතනයකි

වාර්ෂික වාර්තාව - 2021

පටුන

	පිටු අංකය
වාර්ෂික වාර්තාව 2021	01 - 72
අවසන් ගිණුම 2021	73 - 96
විගණකාධිපති වාර්තාව	97 - 98
අවසාන ගිණුම් පිළිබඳ විගණන මතය	99 - 102
විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්ගේ නිරීක්ෂණයන්	103

ජාතික සමාජ සංවර්ධන ආයතනය

දැක්ම

සමාජ වැඩ අධ්‍යාපනයේ පුහුණු කටයුතුවල හා පර්යේෂණවල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ඨ මධ්‍යස්ථානයක් බවට පත්වීම.

මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය සහ සමාජ සුභසාධනය සඳහා සියලුම මට්ටම්වලදී අවශ්‍ය සමාජ වැඩ පිළිබඳ කුසලතා පුර්ණ මිනිස් බල අවශ්‍යතා සපුරාගැනීම සමාජ වැඩ පිළිබඳ අවශ්‍ය දැනුම හා තාක්ෂණයන් යොදා ගනිමින් සමාජයට සුවිශේෂී සේවයක් සැපයීම.

සමාලෝචනය

සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ජාතික සමාජ සංවර්ධන ආයතනය සමාජ වැඩ අධ්‍යාපනය ලබා දෙනු ලබන ශ්‍රී ලංකාවේ ඇති එකම ආයතනයයි. අප ආයතනය 1952 වර්ෂයේ දී ආරම්භ කර පවත්වාගෙන යනු ලබයි. 1992 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මඟින් උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් වී ඇති අප ආයතනය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා පනතේ 25ඒ වගන්තිය යටතේ උපාධි පිරිනැමීමට බලය ඇති ආයතනයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. සමාජ සංවර්ධනය උදෙසා සමාජ වැඩ, සමාජ සුභසාධනය, සමාජ සංවර්ධනය සහ මනෝ විද්‍යාත්මක උපදේශනය, ප්‍රජා පාදක විශෝධන නිලධාරීන් සඳහා පාඨමාලාව යනාදි වශයෙන් පාඨමාලා රැසක් ක්‍රියාත්මක කරනු ලබයි. අප ආයතනය සමාජ සේවා විද්‍යාලය, පුහුණු හා පර්යේෂණ යන අධ්‍යයන අංශ තුනකින් සහ පාලන හා මුදල් යන අංශයන්ගෙන් සමන්විත වේ.

ජාතික සමාජ සංවර්ධන ආයතනය මඟින් සමාජ වැඩ පශ්චාත් උපාධිය, සමාජ වැඩ උපාධිය, සමාජ වැඩ උසස් ඩිප්ලෝමා, ඩිප්ලෝමා, සහතික පත්‍ර හා පුහුණු හා පර්යේෂණ වැඩසටහන් සියල්ල ජාතික අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සකස් කර ක්‍රියාත්මක කරනු ලබයි. මෙසේ සකස් කිරීමේ දී අවශ්‍යතා තක්සේරු වාර්තාව අනුව ලබා ගන්නා ලද තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් පසුව විෂය නිර්දේශයන් සකස් කර ඇත. මෙම විෂය නිර්දේශයන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අනුව ඉතා උසස් මට්ටමකින් සකසා ඇත.

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පැරණිතම අංශය සමාජ සේවා විද්‍යාලයයි. එම අංශය මඟින් ව්‍යාත්තීය සමාජ වැඩ පිළිබඳ උපාධි පිරිනමනු ලබන අතර වර්තමාන ශ්‍රී ලංකාවේ සමාජ වැඩ උපාධිය පිරිනමනු ලබන එකම රාජ්‍ය ආයතනය වන්නේ ද ජාතික සමාජ සංවර්ධන ආයතනයයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත උපාධි පිරිනමනු ලබන උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස දැනට සමාජ සේවා විද්‍යාලය මඟින් ප්‍රධාන වැඩසටහන් හතරක් ක්‍රියාත්මක කරනු ලබයි. එනම් සමාජ වැඩ එක් අවුරුදු ඩිප්ලෝමා, සමාජ වැඩ උසස් ඩිප්ලෝමා, සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය, සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධිය ලෙස සඳහන් කළ හැක. විශේෂයෙන් අප ආයතනයේ පාඨමාලාවන්හි න්‍යායාත්මක දැනුමට සමගාමීව ප්‍රායෝගික ක්ෂේත්‍ර පුහුණුවීම් ආදිය මූලික කරගෙන සහභාගිවන්නන් තුළ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය තුළින් ඔවුන් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නියමුවන් ලෙස ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දී ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබා ගැනීම ඉලක්ක කරගෙන ඇත.

පුහුණු අංශය මඟින් සමාජ වැඩ විෂයයට සමගාමී පුහුණු වැඩසටහන් සංවර්ධනය කර ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන්ම වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල ඉල්ලීම අනුව පුහුණු වැඩසටහන් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන හා ඒ ආශ්‍රිත ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් සංවිධානය කරනු ලබයි. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය මඟින් මෙතෙක් කිසියම් විශ්වවිද්‍යාලයකින් ආරම්භ කර නොමැති උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලාව හා පශ්චාත් උපාධි පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු සුදානම් කර ඇත. මේ ආකාරයට පුළුල් ක්ෂේත්‍ර ගණනාවක් පදනම් කර ගනිමින් පුහුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කරනු ලබයි. එහදි දීර්ඝ කාලීන හා කෙටි කාලීන පුහුණු වැඩසටහන් හා පාඨමාලාවන් මෙන්ම අනෙකුත් ව්‍යාත්තීය පාඨමාලාවන් ද රටේ පවතින අවශ්‍යතා අනුව සකස් කරමින් සමාජ සංවර්ධනයට අවශ්‍ය පුහුණු ශ්‍රමය සපයනු ලබයි.

එපමණක් නොව අප ආයතනයේ සමාජ සංවර්ධන ප්‍රතිපත්ති පර්යේෂණ හා ප්‍රකාශන අංශය සමාජ වැඩ, සමාජ සුබසාධන හා සමාජ සංවර්ධන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ විවිධ පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීමත්, එම පර්යේෂණ වාර්තා හා ශාස්ත්‍රීය ග්‍රන්ථ ප්‍රකාශයට පත් කිරීමක් සිදු කරනු ලබයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ සමාජ සුබසාධන හා සංවර්ධන විෂය ක්ෂෙත්‍රයට අදාළ සමාජ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය වන පර්යේෂණාත්මක නිගමනයන් තුළින් අවශ්‍ය දායකත්වය ලබා දීම සඳහා කටයුතු කරනු ලබයි. තවද භාෂා ත්‍රිත්වයෙන්ම සමාජ වැඩ පර්යේෂණාත්මක පත්‍රිකා අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන අතර මෙම ප්‍රකාශන අන්තර් ජාතික ප්‍රමිතියට අනුව සම්පාදනය කර ඇත. ශ්‍රී ලංකාවේ පවතින තත්කාලීන සමාජ ගැටලු විසඳීම සඳහා සමාජ වැඩ මැදිහත්කරණය සිදු කරන ආකාරය පිළිබඳ යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීම පර්යේෂණ මගින් සිදු කරනු ලබයි.

එමෙන්ම මෙම අධ්‍යයන අංශ තුනට අමතරව පරිපාලන හා මූල්‍ය අංශයෙන් මෙම සියලු කාර්යයන් පරිපාලනය හා කළමනාකරණය සිදු කරනු ලබයි. ආයතනයට අනුබද්ධ ප්‍රාදේශීය මධ්‍යස්ථාන හතරක් අනුරාධපුර (තලාව), හම්බන්තොට (රන්න), කිළිනොච්චි හා අම්පාර යන ප්‍රදේශයන්හි ආරම්භ කර පවත්වාගෙන යනු ලබන අතර අප ආයතනයේ අධ්‍යයන පර්යේෂණ හා පුහුණු පාඨමාලා මෙම මධ්‍යස්ථානයන් කේන්ද්‍ර කර ගනිමින් එම ප්‍රදේශයන්හි අවශ්‍යතා අනුව සැලසුම් කර පවත්වා ගෙන යනු ලබයි. අප ආයතනයට වර්ග අඩි 100,000 ක ස්ථිර ගොඩනැගිලි සංකීර්ණයක් සිදුව ප්‍රදේශයේ සාදා නිම කරමින් පවතී. එමගින් ආයතනයේ අධ්‍යයන කටයුතු සඳහා බදවාගන්නා සිසුන් සංඛ්‍යාව ප්‍රවර්ධනය කර ගැනීමට අවකාශ ලැබෙන අතර, රටේ පවතින අවශ්‍යතා අනුව නව පාඨමාලාවන් ආරම්භ කර පවත්වා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

මේ අනුව වර්තමානය වන විට අප ආයතනය රටෙහි පවතින අධ්‍යාපනික අවශ්‍යතා මූලික කර ගනිමින් රටට අවශ්‍ය මිනිස් බල ශ්‍රමය පුහුණු කිරීම තුළින් සමාජ වැඩ වෘත්තිකයන් බිහි කිරීම සිදු කරනු ලබන අතර ඒ මගින් ප්‍රජාව සවිබලගැන්වීමේ කටයුතුවල නියුක්තවී කටයුතු කරනු ලබයි. එමෙන්ම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් අධ්‍යාපනික වැඩසටහන් හවුමාරු කර ගනිමින් ආයතනයේ අරමුණු හා කාර්යභාරය ප්‍රජාව අතරට ගෙනයාමේ අවස්ථා තව තවත් පුළුල් කර ගනිමින් කටයුතු කරනු ලබන අප ආයතනය වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය උදෙසා මහඟු කාර්යභාරයක් ඉටු කරනු ලබයි. මීට අමතරව අප ආයතනයේ වෙබ් අඩවිය මගින් සියලු තොරතුරු දැනගැනීමට හැකිවනු ඇත. වර්තමානයේ ආයතනය ශ්‍රී ලාංකික ප්‍රජාව සවිබල ගැන්වීම් හා සංවර්ධනය කරා යොමු කිරීමේ මහඟු කාර්යභාරයක් ඉටු කරමින් සිටින බව ප්‍රසංශාත්මකව ප්‍රකාශ කර සිටිමි.

එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක,
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.),
ජාතික සමාජ සංවර්ධන ආයතනය

ජාතික සමාජ සංවර්ධන ආයතනය

වාර්ෂික වාර්තාව - 2021

01. හැදින්වීම

1992 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ස්ථාපනය කර ඇති ජාතික සමාජ සංවර්ධන ආයතනයෙහි ආරම්භය 1952 දී ස්වෙච්ඡා සංවිධාන කිහිපයක සහභාගිත්වයෙන් පිහිටුවා ගන්නා ලද ''සමාජ වැඩ පිළිබඳ ආයතනයයි''. 1964 දී මෙය රජයට පවරා ගනු ලැබීමත් සමග ''ලංකා සමාජ සේවා විද්‍යාලය'' ලෙස නම් කෙරිණි. එයින් පසුව ජාතික සමාජ සංවර්ධන ආයතනය 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ අංක 25A වගන්තිය යටතේ උපාධි පිරිනමන ආයතනයක් බවට පත්විය.

අපගේ දැක්ම

සමාජ වැඩ අධ්‍යාපනයෙහි පුහුණු කටයුතුවල හා පර්යේෂණ වල දේශීය හා ජාත්‍යන්තර ලෙස විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම.

අපගේ මෙහෙවර

''සෑම සමාජ මට්ටමකම වැඩ කළ හැකි නිපුනතාවලින් යුතු සමාජ වැඩකරුවන් පුහුණු කිරීම තුළින් සමාජ සංවර්ධනය සඳහා අවශ්‍ය මානව සම්පත වැඩි දියුණු කිරීමත් සමාජ වැඩ පරිචයට අවශ්‍ය නව දැනුම හා තාක්ෂණය වර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම තුළින් සමාජ සුභසාධනය හා සමාජ සංවර්ධනයට අවශ්‍ය සුවිශේෂී සේවයක් සැපයීම.

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ සඳහන් කර ඇති පරිදි ආයතනයේ අරමුණු,

01. වෘත්තිය සමාජ වැඩ අධ්‍යාපනය, සමාජ සුභ සාධන කළමනාකරණය හා සමාජ සංවර්ධනය පිළිබඳ උසස් පාඨමාලා පැවැත්වීම, ප්‍රවර්ධනය හා ඒවා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මට්ටමකට ගෙන යාම.

02. පුහුණු පාඨමාලා පුළුල් කිරීම, ශක්තිමත් කිරීම, සමාජ සුභ සාධනය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ වෙනත් ආයතන සමඟ සහයෝගිත්වයෙන් ඒවා පැවැත්වීම, අඩු වරප්‍රසාදලාභීන් බල ගැන්වීම, මානව කුසලතා හා වෘත්තිය කුසලතා සංවර්ධනය තුළින් පුද්ගලයන්ට වඩා හොඳ ජීවන මට්ටමක් ලබා දීම.

03. සමාජ වැඩ අධ්‍යාපනය, පුහුණුව හා සමාජ සුභසාධනය හා සංවර්ධනයට අදාල පර්යේෂණ කටයුතු කිරීම, ප්‍රවර්ධනය හා පවත්වාගෙන යාම තුළින් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ දියුණුව සැලසීම.

04. සමාජ සුභ සාධනය හා සමාජ සංවර්ධනය සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමට, සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශේෂ දායකත්වය සැපයීම.

05. ඉහත සියළුම අරමුණු සාර්ථකව ලගා කර ගැනීමට අවශ්‍ය වන මූල්‍යමය අධ්‍යයන හා අනධ්‍යයන මිනිස් බලය හා විශේෂයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයට ස්ථීර ස්ථානයක් ස්ථාපනය කර ගැනීම වැනි යටිතල පහසුකම් ඇතුලු අනෙකුත් සම්පත් ලබා ගැනීම.

ඉහත කරුණු සාක්ෂාත් කරගැනීම සඳහා මෙම ආයතනය පහත සඳහන් කාර්යන්හි නිරත වේ.

01. සමාජ වැඩ වෘත්තියවේදී අධ්‍යාපනය.
02. සමාජ වැඩ පිළිබඳ දේශීය හා ජාත්‍යන්තර පුහුණු පාඨමාලා පැවැත්වීම.
03. සමාජ වැඩ සමාජ සුභසාධනය සහ සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රකාශන පළ කිරීම.
04. සමාජ සුභසාධන ක්ෂේත්‍රයේ උපදේශන සේවා පැවැත්වීම.
05. සමාජ සුභසාධන කටයුතු වල නියැලි සිටින රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල සේවකයින්ගේ කළමනාකරණ හා වෘත්තිය කුසලතා වැඩි දියුණු කිරීම.
06. සමාජ සුභසාධන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ගරු ඇමතිතුමාට අවශ්‍ය සහය ලබා දීම.

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ක්‍රියාත්මක වැඩ සටහන් පහත සඳහන් පරිදිය.

01. සමාජවැඩ පිළිබඳ ශාස්ත්‍රපති, සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලා, සමාජ වැඩ ඩිප්ලෝමා, අතුරු වෘත්තිය පාඨමාලා හා වෙනත් පුහුණු පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධනය, සංවිධානය කිරීම, පැවැත්වීම සහ ක්ෂේත්‍ර වැඩ සම්බන්ධීකරණය
02. සමාජ සුභසාධන හා සමාජ ප්‍රතිපත්ති පිලිබඳ පර්යේෂණ දියුණු කිරීම, පැවැත්වීම හා ක්‍රියාත්මක කිරීම
03. සමාජ වැඩ ප්‍රකාශන හා පත්‍රිකා එළි දැක්වීම
04. සමාජ සුභසාධන කාර්යන්හි නියැලෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වල නිලධාරින්ගේ වෘත්තිමය කළමනාකරණ සංවර්ධනය කිරීම සඳහා විදේශිය හා දේශිය ආයතනවල මූල්‍ය පහසුකම් ඇතිව සම්මන්ත්‍රණ වැඩමුළු පැවැත්වීම
05. ගරු ඇමතිතුමාට සමාජ සුභසාධන ප්‍රතිපත්ති සැලසුම් කිරීමට, ක්‍රියාත්මක කිරීමට, සහාය වීම සඳහා එතුමාගේ සාකච්ඡා හා කාර්ය මණ්ඩල රැස්වීම්වලදී ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහය වීම සහ ඒ සඳහා ලිඛිත යෝජනා ඉදිරිපත් කිරීම
06. රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශවල සමාජ සුභසාධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී සමාජ වැඩ සිසුන් එම ආයතනවලට ඔවුන්ගේ ව්‍යාපෘති මගින් අනුයුක්ත කිරීම, ඔවුන්ගේ සංවර්ධන ක්‍රියාදාමයන්ට අවශ්‍ය මාර්ගෝපදේශයන් සැපයීම, ඔවුන්ගේ සේවාවන් වඩාත් අර්ථවත් පිණිස උපදේශන සේවා රැස්වීම් හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

02. පාලක සභාව

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 7 (1) උප වගන්තිය ප්‍රකාරව 2020 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතන පාලක සභාවේ සංයුතිය මෙසේය.

1. නීල් බණ්ඩාර හපුහින්න මහතා (සභාපති-නිල බලයෙන්)	-	ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය 2020.07.08 දින සිට මේ දක්වා
2. එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මිය	-	අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)2019.01.01 සිට මේ දක්වා

3.	ඒ.පී.එල්.ඩී.ඩී.එන්. ප්‍රනාන්දු මිය	-	සාමාජික - 2020.07.08 දින සිට මේ දක්වා
4.	මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මයා	-	සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා
5.	මාහාචාර්ය ප්‍රේමකුමාරද සිල්වා මයා	-	සාමාජික - 2020.07.08 දින සිට මේ දක්වා
6.	මහාචාර්ය ආර්.එම්.කේ. රත්නායක	-	සාමාජික - 2020.07.08 දින සිට මේ දක්වා
7.	ආචාර්ය ඉරේෂා දර්ශනී මෙය	-	සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා
8.	ජගත් වැල්ලවත්ත මහතා	-	සාමාජික - 2020.02.028 දින සිට මේ දක්වා
9.	ගෝඨාභය ජයරත්න මහතා	-	සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා
10.	චන්දිමා වික්‍රමසිංහ මිය	-	සාමාජික - 2020. 02.28 දින සිට මේ දක්වා
11.	ඩී. විදානගමආච්චි මහතා	-	සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා
12.	සිසිර රත්නායක මහතා	-	සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා
13.	රෝයි නිලන්ත සිල්වා මහතා	-	සාමාජික - 2020.02.28 දින සිට මේ දක්වා
14.	ටී.එන්. හෙට්ටිආරච්චි මහතා	-	සාමාජික - 2020.05.18 දින සිට මේ දක්වා

03. අධ්‍යයන කටයුතු පිළිබඳ මණ්ඩලය

1992 අංක 41 දරණ ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ 10 (1) උප වගන්තිය ප්‍රකාරව අංක 796/11 හා 1993.12.09 දින රජයේ ගැසට් පත්‍රයේ දක්වා ඇති නියමයන්ට අනුව පත් කරන ලද අධ්‍යයන කටයුතු මණ්ඩලය මෙසේය.

1.	නීල් බණ්ඩාර හපුහින්න මහතා (සභාපති-නිල බලයෙන්)	-	ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. 2020.07.08 දින සිට මේ දක්වා
2.	එම්.ටී.ආර්.ෂාමිණී අත්තනායක මිය	-	අධ්‍යක්ෂ ජනරාල් (රා.ආ.) 2018.07.09 - 2019.01.01 දක්වා - 2019.01.01 සිට මේ දක්වා අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
3.	මහාචාර්ය ඩබ්.එම්.ධනපාල මහතා	-	සමාජ විද්‍යා අධ්‍යයන අංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
4.	මහාචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා	-	අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය.
5.	ආචාර්ය උපාලි පන්නිලගේ මහතා	-	පීඨාධිපති, මානව ශාස්ත්‍ර පීඨය, රුහුණ විශ්ව විද්‍යාලය
6.	මහාචාර්ය සුභාංගි එම්.කේ.හේරත් මිය	-	සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය
7.	මහාචාර්ය ඒ.ඩබ්.කේ.ඩබ්.සුභසිංහ මිය	-	සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැළණිය විශ්ව විද්‍යාලය
8.	ආචාර්ය එස්.එම්.ඒ.කේ. සමරකෝන් මහතා	-	අංශාධිපති, වාණිජ හා කළමනාකරණ පීඨය, කැළණිය විශ්ව විද්‍යාලය
9.	වරදගෞරි වාසුදේවන් මිය	-	අධ්‍යක්ෂ (පුහුණු අංශය), ජාතික සමාජ සංවර්ධන ආයතනය
10.	කේ.එම්.වයි. කරුණාරත්න මහතා	-	අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය), ජාතික සමාජ සංවර්ධන ආයතනය
11.	එම්.එස්.එම්. අස්මියාස් මහතා	-	අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන ප්‍රතිපත්ති පර්යේෂණ හා ප්‍රකාශන අංශය), ජාතික සමාජ සංවර්ධන ආයතනය
12.	සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මිය	-	ලේඛකාධිකාරී

04.විගණන හා කළමනාකරණ කමිටුව

1. දිලූපා ප්‍රනාන්දු මිය	-	අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව)
2. ඩී. විදානගමාච්චි මහතා	-	විශ්‍රාමික නියෝජ්‍ය ලේකම් (මුදල් අමාත්‍යාංශය)
3. රෝයි නිලන්ත සිල්වා මහතා	-	කළමනාකරණ උපදේශක (කොලේජ් විලේජ්)
4. ඩී.එම්.ජී.පී. මල්කාන්ති	-	ප්‍රධාන අභ්‍යන්තර විගණක (සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
5. එස්.කේ. සමරසිංහ මිය	-	විගණන අධිකාරිය(ජාතික විගණන කාර්යාලය)

05. අධ්‍යයන කාර්ය මණ්ඩලය

අධ්‍යයන කටයුතු ප්‍රධානී

එම්.ටී.ආර්. ෂාමිණී අත්තනායක මිය	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) 2017.01.16 සිට

2019 වර්ෂය තුල ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංයුතිය මෙසේය.

(අ) සමාජ සේවා විද්‍යාලය

1. කේ.එම්.වයි. කරුණාරත්න මහතා	-	අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය) 2017.01.24 සිට මේ දක්වා
2. වර්ධරාජා ජෙයරූබන් මහතා	-	කථිකාචාර්ය II 2006.07.03 සිට 2012.07.02 දක්වා 1. කථිකාචාර්ය I 2012.07.03 සිට2017.07.31 දක්වා 2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2017.08.01 සිට මේ දක්වා
3. ඊ.ඒ.එම්.එස්.ජී. විජේසේකර මිය	-	කථිකාචාර්ය II 2006.07.03 සිට 2012.07.06 දක්වා 1. කථිකාචාර්ය I 2012.07.07 සිට2017.07.31 දක්වා 2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 2017.08.01 සිට මේ දක්වා
4. යූ.එල්.එම්. අශ්කර් මහතා	-	කථිකාචාර්ය II 2009.03.02 සිට 2015.03.01 දක්වා 1. කථිකාචාර්ය I 2015.03.02 සිට මේ දක්වා
5. එම්.කේ.පී.අයි.යූ. ගුණරත්න මිය	-	කථිකාචාර්ය II 2013.09.16 සිට2021.03.12 දක්වා
6. සී.එම්. මුණසිංහආරච්චි මිය	-	කථිකාචාර්ය II 2013.09.16 සිට මේ දක්වා
7. වී. බාලමති මිය	-	කථිකාචාර්ය II 2013.09.16 සිට මේ දක්වා
8. එච්.එම්.ඩී.එස්. හේරත් මිය	-	කථිකාචාර්ය II 2014.05.02 සිට මේ දක්වා
9. එච්.එම්.එස්. නිරෝෂණී මිය	-	කථිකාචාර්ය II 2014.05.02 සිට මේ දක්වා
10. එල්.සී. ඉනෝකා ජයසේන මිය	-	කථිකාචාර්ය II 2015.12.01 සිට මේ දක්වා
11. වයි.එච්. සමුද්‍රිකා සිල්වා මිය	-	කථිකාචාර්ය II 2015.12.01 සිට මේ දක්වා
12. ඒ.එම්. මානාමුදලි මිය	-	කථිකාචාර්ය II 2018.08.01 සිට මේ දක්වා
13. ඒ.පී.එල්. බුද්ධි නිරුක්ෂි මිය	-	කථිකාචාර්ය II 2018.08.01 සිට මේ දක්වා
14. ඩී.එම්.ඩබ්.කේ. චන්ද්‍රසිරි මහතා	-	පුස්තකාලයාධිපති 2015.06.01 සිට මේ දක්වා

(ආ) පර්යේෂණ අංශය

01. එම්.එස්.එම්. අස්මියාස් මහතා	-	අධ්‍යක්ෂ (පර්යේෂණ) 2017.05.01 සිට මේ දක්වා
02. ජේ.කේ.පී.යූ. කීර්ති මහතා	-	පර්යේෂණ නිලධාරී 2013.08.01 සිට2018.07.31දක්වා
		ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
03. එස්.හරිහරතාමෝදරන් මයා	-	ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
04. බී.ඒ. නිලූකා විජේබණ්ඩාර මිය	-	පර්යේෂණ නිලධාරී 2017.01.16 සිට මේ දක්වා
05. එච්.කේ.එස්.කේ. සිරිකුමාර මිය	-	පර්යේෂණ නිලධාරී 2014.05.02 සිටමේ දක්වා
06. ඒ.එච්. ඉන්දික සංජීව මහතා	-	පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා
07. කේ.සී.කේ.ද තාබ්‍රේව් මිය	-	පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා
09. එස්.එච්.එන්.මධුෂානි සිල්වා මිය	-	පර්යේෂණ සහකාර 2014.05.02 සිට මේ දක්වා

(ඇ) පුහුණු අංශය

01. වරදගෞරි වාසුදේවන් මිය	-	අධ්‍යක්ෂ (පුහුණු) 2015.05.05 සිට මේ දක්වා
02. දීප්ති නිරෝෂිකා මිය	-	පුහුණු නිලධාරී II 2007.03.01සිට 2013.02.28 දක්වා
		පුහුණු නිලධාරී I 2013.03.01 සිට 2018.07.31 දක්වා
		ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී 2018.08.01 සිට මේ දක්වා
03. කුමුදිනි වැදිසිංහ මිය	-	පුහුණු නිලධාරී II 2012.05.01 සිට 2019.09.30 දක්වා
		ජ්‍යෙෂ්ඨ පුහුණු නිලධාරී 2019.10.01 සිට මේ දක්වා
04. බී.කේ.එස්. කරුණාරත්න මහතා	-	පුහුණු නිලධාරී II 2013.08.01 සිට මේ දක්වා
05. පී.සී. හෙට්ටිආරච්චි මහතා	-	පුහුණු නිලධාරී II 2013.08.01 සිට මේ දක්වා
06. ඒ.එම්.කේ.එල්. අධිකාරි මිය	-	පුහුණු නිලධාරී II 2013.08.01 සිට මේ දක්වා
07. ඒ.එච්. උබයදුල්ලා මහතා	-	පුහුණු නිලධාරී II 2013.08.01 සිට මේ දක්වා
08. ජේ.එච්.අයි. ප්‍රසාද් මහතා	-	පුහුණු නිලධාරී II 2013.08.01 සිට මේ දක්වා
09. ටී. තර්ෂන් මහතා	-	පුහුණු නිලධාරී II 2013.09.02 සිට මේ දක්වා
10. වයි.එම්. නිම්සාත් මහතා	-	පුහුණු නිලධාරී II 2017.07.03 සිට මේ දක්වා
11. බී.ජී.අයි. මදුෂානී සමරසිංහ මිය	-	පුහුණු නිලධාරී II 2017.07.03 සිට මේ දක්වා

අනධ්‍යයන කාර්ය මණ්ඩලය

2020 වර්ෂයේ ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පරිපාලන අංශයේ සංයුතිය පහත පරිදි වේ.

01. එම්.ටී.ආර්. ෂාමිණි අත්තනායක මිය	-	අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.) 2019.01.01 සිට මේ දක්වා
02. එල්.කේ. පුෂ්පකාන්ති මිය	-	අධ්‍යක්ෂ (පාලන හා මුදල්) 2017.03.01 සිට මේ දක්වා
03. සී.එච්.ඩී. හෙට්ටිආරච්චි මිය	-	ලේඛකාධිකාරී 2013.09.16 සිට මේ දක්වා
04. යූ.ඩී.ඩී. ධනුෂ්කා උස්හෙට්ටි මිය	-	අභ්‍යන්තර විගණක 2011.10.17 සිට මේ දක්වා

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	ස්ථීර	ද්විතියන පදනම	අනියම්
01. ගිණුම් නිලධාරී	01	-	-	-
02. සහකාර ලේඛකාධිකාරී	01	-	-	-
03. පරිගණක වැඩසටහන් සම්පාදක	01	01	-	-
04. ව්‍යාපෘති වැඩසටහන් සම්පාදක	01	01	-	-
05. කළමනාකරණ සහකාර	34	34	-	-
06. නේවාසිකාගාර පාලිකා	01	01	-	-
07. ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික	01	-	-	-
08. ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක	01	01	-	-
09. භාෂා පරිවර්තක	02	01	-	-
10. පිළිගැනීමේ නිලධාරිනි/දුරකථන ක්‍රියාකරු	01	01	-	-
11. රියදුරු	09	08	-	-
12. කාර්යාල කාර්ය සහායක	15	13	-	-
13. වැඩසටහන් සහකාර (ස්ථානභාර)	04	03	-	-
14. මුරකරු	01	01	-	-

2021 වර්ෂයේ කාර්යයසාධනය

පාලන හා මුදල් අංශයේ 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය

අ. අංකය	වැඩසටහනේ නම	ආරම්භක දිනය අවසන් කළ දිනය / පවත්වන ලද දින	මූල්‍ය ප්‍රගතිය		
			වෙන් කළ මුදල (මිලියන)	මුළු වියදම (මිලියන)	ශේෂය (මිලියන)
1	සීදුව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු	2017.10.26 2021.12.31	229	121	108
2	නව ගොඩනැගිල්ලේ භෞතික සම්පත් වැඩිදියුණු කිරීම	2021.01.13 2021.12.31	20	-	20*
3	ආයතනය සඳහා ප්‍රාග්ධන වියදම් යටතේ භාණ්ඩ මිලදීගැනීම.	2021.01.13 2021.12.31	7**	5.6	-
4	අනුමත අධ්‍යයන හා පුහුණු වැඩසටහන සඳහා වන මාර්ගෝපදේශන මාලාව ක්‍රියාත්මක කිරීම.	2021.01.13 2021.12.31	0.5	0.135	0.365

* ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර රාජ්‍ය දැව සංස්ථාව වෙත ඇණවුම් ලිපිය භාරදුන්නද රට තුළ පැවති වාතාවරණය තුළ භාණ්ඩ ලබාදීමේ ගැටළු පවතින බව ඔවුන් දැනුම් දෙන ලදී.

**2021.08.31 දිනෙන් ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය වියදම් සමාලෝචනය යටතේ අයවැය ප්‍රතිපාදනවලින් ඉතිරිකිරීමට අපේක්ෂිත මුදල ලෙස ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ මිලියන 10 ක මුදලින් මිලියන 3 ක් ඉතිරි කර ඉතිරි මිලියන 7 පමණක් වියදම් දරන බව භාණ්ඩාගාරය වෙත දැනුම් දෙන ලදී. නමුත් මෙම මිලියන 7 න් අක්මුදල් ලෙස ලබා දෙන ලද්දේ මිලියන 5.6 ක් පමණි.

ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා ඉදිවෙන සීදුව ගොඩනැගිලි සංකීර්ණය

ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙනුවෙන් සීදුව ඉදිවෙමින් පවතින ගොඩනැගිලි සංකීර්ණය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මිලියන 1000 ක මුදලක් වෙන් කර ඇති අතර එහි ඉදිකිරීම් කටයුතු 2017 වසරේ ආරම්භ විය. Wing A හා Wing B ලෙස ගොඩනැගිලි දෙකකින් සමන්විත ගොඩනැගිලි සංකීර්ණයේ Wing B ගොඩනැගිල්ල අධ්‍යයන ගොඩනැගිල්ල ලෙසද Wing A ගොඩනැගිල්ල පරිපාලන ගොඩනැගිල්ල ලෙසද නම් කර ඇත. 2021 වර්ෂය සඳහා ගොඩනැගිල්ලේ ඉදිකිරීම් වෙනුවෙන් රුපියල් මිලියන 229 ක ප්‍රතිපාදන වෙන් කර දී තිබූ අතර 2021 වර්ෂයේදී ගොඩනැගිල්ල සඳහා වියදම් වූ මුදල රුපියල් මිලියන 121 කි. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් සිදු කරන අතර 2021 වර්ෂයේ දෙසැම්බර් වන විට Wing B ගොඩනැගිල්ල 96% ක හා Wing A ගොඩනැගිල්ල 67% ක භෞතික ප්‍රගතියක් පෙන්නුම් කර ඇත. ආයතනය 2020 වර්ෂයේ සිට අධ්‍යයන හා පරිපාලන කටයුතු Wing B ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබයි.

ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් ප්‍රගතිය

Wing A

ඉදිරිපස පෙනුම



තුන්වන මහලේ ඉදිකිරීම් කටයුතු



දෙවන මහළ ටයිල් ඇතිරීම



ජලනල එලීමේ කටයුතු



Wing B

ඉදිරිපස පෙනුම



පැති පෙනුම



ජාතික සමාජ සංවර්ධන ආයතනය
සමාජ සේවා විද්‍යාලය - 2021 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය

<u>සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී සහ සමාජ වැඩ පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් පවත්වන ලද වැඩසටහන්</u>

අනු අංකය	පාඨමාලාවේ නම, මාධ්‍ය හා ස්ථානය	ආරම්භ කළ දිනය	සහභාගී වන සිසුන් සංඛ්‍යාව	පාඨමාලාවේ ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය ජනවාරි සිට දෙසැම්බර් දක්වා	
					ප්‍රතිපාදන (රු.)	වියදම (රු.)
1	සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව 2016/2020 (ඉංග්‍රීසි මාධ්‍යය)	09.08.2016	32	අවසන් ප්‍රජා වැඩ වාර්තාව භාරදී ඇත.	6,227,000.00	ජනවාරි සිට දෙසැම්බර් දක්වා (සමාජ වැඩ ශාස්ත්‍රවේදී) මුළු වියදම 1,745,438.00
2	සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව 2017/2018 (ඉංග්‍රීසි මාධ්‍යය)	17.07.2017	30	හතරවන වසර දෙවන සමාසික පංති කාමර දේශන සම්පූර්ණ කර ඇත. ඔවුන් ක්ෂේත්‍ර අධ්‍යයන III සඳහා යොමු කර ඇත.		
3	සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව 2018/2019 (ඉංග්‍රීසි මාධ්‍යය)	19.06.2018	42	ක්ෂේත්‍ර වැඩ II වැඩසටහන පවත්වයි.		
4	සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව 2019/2020 (ඉංග්‍රීසි, සිංහල හා දෙමළ මාධ්‍යය	24.02.2020	සිංහල-46 දෙමළ-45 ඉංග්‍රීසි-39 එකතුව-130	ක්ෂේත්‍ර ගත කිරීම් I සම්පූර්ණයි. පළමු වසර දෙවන සමාසික පංති කාමර දේශන අවසන් කර ඇත.		
5	සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව 2020/2021 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)	21.04.2021	සිංහල-89 දෙමළ-80 ඉංග්‍රීසි-25 එකතුව-194	පළමු වසර දෙවන සමාසික පංති කාමර දේශන පවත්වයි.	මිලියන 3	3,000,000.00
6	ශිෂ්‍ය සුභසාධනය (ආයතනික ශිෂ්‍යාධාර)					
7	සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව 2021/2022 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) නව කණ්ඩායම			තෝරාගත් සිසුන්ගේ නාම ලේඛනය (සිංහල-214, දෙමළ-401, ඉංග්‍රීසි-53) *අධ්‍යයන කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.		
8	උසස් සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව(2018/19) සිංහල හා දෙමළ මාධ්‍යය)	05.03.2018	දෙමළ-16 සිංහල-35	විභාග මණ්ඩල සම්පූර්ණ කර ඇත.	නොමිලේ පවත්වයි.	

අනු අංකය	පාඨමාලාවේ නම, මාධ්‍ය හා ස්ථානය	ආරම්භ කළ දිනය	සහභාගී වන සිසුන් සංඛ්‍යාව	පාඨමාලාවේ ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය ජනවාරි සිට දෙසැම්බර් දක්වා	
9	උසස් සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව 2019/20 සිංහල හා දෙමළ මාධ්‍යය)	05.06.2019	සිංහල-22 දෙමළ-16	ප්‍රජා වැඩ සඳහා ශිෂ්‍යයින් අනුයුක්ත කර ඇත.		
10	සමාජ වැඩ ඩිප්ලෝමා පාඨමාලාව (ක්ෂේත්‍ර නිලධාරීන්) 2020/21	22.09.2020	38	ක්ෂේත්‍ර වැඩ සඳහා ශිෂ්‍යයින් අනුයුක්ත කර ඇත.		
11	උසස් සමාජ වැඩ ඩිප්ලෝමාව (සිංහල හා දෙමළ මාධ්‍යය) 2020/21		අයදුම්පත් ලැබෙමින් පවති.	අයදුම්පත් ඉදිරිපත් කර ඇත.	නොමිලේ පවත්වයි.	
12	සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව 2018/19 (ඉංග්‍රීසි මාධ්‍යය)	04.05.2018	16	පර්යේෂණ වාර්තා සම්පූර්ණ කර ඇත. ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු සඳහා අනුයුක්ත කර ඇත.	මිලියන 14	මුළු වියදම රු.1,030,284.00 සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව
13	සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2018/19 (දෙමළ හා සිංහල මාධ්‍යය)	12.10.2018	සිංහල-20 දෙමළ-11	පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා දත්ත රැස්කිරීමේ කටයුතුවල නියැලී ඇත. ක්ෂේත්‍ර අධ්‍යයන කටයුතු ද සිදුකරමින් පවති.	මිලියන 14	මුළු වියදම රු.1,030,284.00 සමාජ වැඩ ශාස්ත්‍රපති පාඨමාලාව
14	සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2019/20 (ඉංග්‍රීසි මාධ්‍යය)	04.07.2019	11	දෙවන වසර පළමු සමාසික පංති කාමර දේශන පවත්වයි.		
15	සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2020/21 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) නව කණ්ඩායම	01.04.2021	සිංහල-24 දෙමළ – 28 ඉංග්‍රීසි - 20	පළමු වසර දෙවන සමාසික පංති කාමර දේශන පවත්වයි. .		
16	සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2021/22 (සිංහල, දෙමළ, ඉංග්‍රීසි) නව කණ්ඩායම			මාර්ගගත ක්‍රමයට සම්මුඛ පරීක්ෂණ පවත්වයි.		

පුහුණු අංශය

අනු අංකය	වැඩසටහනේ නම / මාධ්‍ය / ස්ථානය	ආරම්භක දිනය අවසන් කළ දිනය / පවත්වන ලද දින	සහභාගී වූ සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය		
				වෙන් කළ මුදල	මුළු වියදම	ශේෂය
1	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා වල ක්ෂේත්‍ර පුහුණු අත්පොත සංශෝධනය කිරීමේ වැඩමුළුව	2021.04.07 2021 05.10 2021.06.01 2021 10.08 2021.12.09	12	40,000.00	40,000.00	00
2	යෝජිත උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව / උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා / ශාස්ත්‍රපති පාඨමාලාව හඳුන්වා දීම - උපදේශනය පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධියේ, උපදේශන හා තාක්ෂණික කමිටු යෝජනාවලිය උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දීම.	2021 ජනවාරි 2021.10.27 2021.12.03	12	750,000.00	525,000.00	225,000.00
3	ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන හා පුහුණු ප්‍රවර්ධනය කිරීම සඳහා වීඩියෝ දර්ශනය සකස් කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා පදනම් ආයතනයට කරන ලද ගෙවීම්	2021 මාර්තු 23 සහ 24	රජයේ නිලධාරීන් 1,000 දෙනෙකු සඳහා	185000.00	179,000.00	800.00
	ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන හා පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන - මාතර දිස්ත්‍රික්කය	2021.09.30	ජාතික තරුණ සේවා සභාවේ නිලධාරීන් දැනුවත් කිරීම	5,200.00	5,200.00	
4	සමෘද්ධි දෙපාර්තමේන්තුවේ නවක බදවා ගැනීම් කරන ලද සංවර්ධන නිළධාරීන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ පවත්වන ලද කෙටිකාලීන පුහුණු වැඩසටහන	සිංහල මාධ්‍ය - 2021.07.07 සිට අගෝස්තු මස 14 දින දක්වා දින 05 බැගින් සති 05 ක් දෙමළ මාධ්‍ය - 2021.07.07 සිට අගෝස්තු මස 14 දින දක්වා සතියට එක් දිනයක් බැගින් සති 05 ක්	මුළු සංවර්ධන නිලධාරීන් 773 (සිංහල මාධ්‍ය නිලධාරීන් 551 සහ දෙමළ මාධ්‍ය නිලධාරීන් 222)	36,000.00	36,000.00	00
5	ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන (දෙමළ මාධ්‍ය) වැඩසටහන් ගණන - 05			75,000.00	75,000.00	00
i	මත්ද්‍රව්‍ය උපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන	30.03.2021	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 58			
ii	රංග විකිත්සාව පිළිබඳ පුහුණු වැඩසටහන	2021.12.27	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 68			

iii	ජානන වර්යා චිකිත්සාව හැඳින්වීම පිළිබඳ පුහුණු වැඩසටහන	2021.12.28 2021.12.29	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 124 සහ ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 113			
iv	මානසික ශක්තිමත්බව පිළිබඳ පුහුණු වැඩසටහන	2021.12.30	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 83			
v	වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන	2021.12.30	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 83			
6	ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන (සිංහල මාධ්‍ය) වැඩසටහන් ගණන - 05					
i	මත්ද්‍රව්‍ය උපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන	2021.03.30	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 38			
ii	රංග චිකිත්සාව පිළිබඳ පුහුණු වැඩසටහන	2021.12.26	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 136			
iii	ප්‍රජානන වර්යා චිකිත්සාව හැඳින්වීම පිළිබඳ පුහුණු වැඩසටහන	2021.12.21	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 206			
iv	මානසික යහපැවැත්ම පිළිබඳ වැඩසටහන	2021.12.18	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 124			
v	වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහන	2021.12.27	ක්ෂේත්‍ර අධීක්ෂක වරුන් 121			
7	ශුද්ධ වූ පවුලේ කන්‍යා සොයුරියන් වෙනුවෙන් පවත්වන ලද නායකත්වය හා උපදේශනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන	2021.11.01 සිට 16 දක්වා	75	3,000.00	3,000.00	-
8	**අම්පාර මධ්‍යස්ථානය** - මානසික යහපැවැත්ම පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන, අම්පාර කෘෂිකර්ම මධ්‍යස්ථානය - උහන	17/12/2021	සාමාජිකයින් 32	24,800.00	24,765.00	35.00
9	ළමුන් අධ්‍යාපනය සඳහා අභිප්‍රේරණය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන - කිලිනොච්චි මධ්‍යස්ථානය	2021.12.10	සාමාජිකයින් 47	50,000.00	46,590.00	3,410.00
10	ළමුන් අධ්‍යාපනය සඳහා අභිප්‍රේරණය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන - කිලිනොච්චි මධ්‍යස්ථානය	2021.12.21	සාමාජිකයින් 85			
11	වයඹ පළාතේ ගුරු සංගමය මගින් කරන ලද ඉල්ලීමකට අනුව සිදු කරන ලද පාසල් උපදේශනය පිළිබඳ පස්දින පුහුණු වැඩසටහන	29.07.2021–05.08.2021	ගුරුවරුන් 130	10,000.00	6,240.00	3,760.00
12	උතුරු පළාත් ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීමකට අනුව කරන ලද රැකබලාගන්නන් සඳහා ළමා සංවර්ධනය පිළිබඳ පස්දින කෙටි කාලීන පුහුණු වැඩසටහන	29.07.2021–05.08.2021	රැකබලා ගන්නන් 43	10,000.00	5,500.00	4,500.00
13	අම්පාර මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගත් වැඩසටහන - මානසික සෞඛ්‍ය පදනමේ සහාය	07.10.2021	169	නොමිලේ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ		

	ඇතිව මානසික සෞඛ්‍ය වෘත්තිකයින් හඳුනා ගැනීමේ වැඩසටහන			
14	අම්පාර මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගත් වැඩසටහන - මනෝ උපදේශකවරුන් සඳහා චිත්තවේගීමය බුද්ධිය පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන	14.10. 2021	89	නොමිලේ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ
15	අම්පාර මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගත් වැඩසටහන - මානසික සෞඛ්‍ය පදනමේ සහාය ඇතිව පවත්වන ලද අභිප්‍රේරණාත්මක සම්මුඛ සාකච්ඡා පැවැත්වීම ධාරිතා සංවර්ධන වැඩසටහන	21.10.2021	100	නොමිලේ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ
16	අම්පාර මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගත් වැඩසටහන - මහජන දැනුවත් කිරීමේ වැඩසටහන - මානසික සෞඛ්‍ය පදනමේ සහාය ඇතිව පවත්වන ලද සංගීත චිකිත්සාව වැඩසටහන	28.10.2021	178	නොමිලේ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ
17	**රන්න මධ්‍යස්ථානය** හම්බන්තොට ධර්මපාල විද්‍යාලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව සාමාන්‍ය පෙළ සිසුන් සඳහා පවත්වන ලද අභියෝග ජය ගැනීම හා විභාගයට මුහුණ දීම පිළිබඳ මාර්ගගත වැඩසටහන	04.10.2021	60	නොමිලේ මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ
	සෞභාග්‍යා දැනුවත් කිරීමේ වැඩසටහන්			
18	තලාව මධ්‍යස්ථානය පදනම් කරගත් ඉපලෝගම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කරන ලද ඉල්ලීමකට අනුව පෙර පාසල් ගුරුවරුන් වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	2021.09.26	86 පෙර පාසල් ගුරුවරුන්	නොමිලේ පවත්වන ලද වැඩසටහන්.
19	තලාව මධ්‍යස්ථානය විසින් දෙමාපියන් වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන	2021.09.24	186 දෙමාපියන්	- එම -
20	කිලිනොච්චි මධ්‍යස්ථානය පදනම් කර ගනිමින් අතිරේක කලාප අධ්‍යක්ෂ විසින් කරන ලද ඉල්ලීමකට අනුව පවත්වන ලද පෙර පාසල් ගුරුවරුන් වෙනුවෙන් පවත්වන ලද කොවිඩ් 19 පිළිබඳ පස් දින දැනුවත් කිරීමේ වැඩසටහන	2021.09.23 – 2021.10.11	45 පෙර පාසල් ගුරුවරුන්	- එම -
21	අම්පාර මධ්‍යස්ථානය පදනම් කර ගනිමින් පවත්වන ලද ගුරුවරුන් හා දෙමාපියන් වෙනුවෙන් මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ පවත්වන ලද මාර්ගගත වැඩසටහන	2021.09.23	300 දෙමාපියන් හා ගුරුවරුන්	- එම -
22	අම්පාර මධ්‍යස්ථානය පදනම් කර ගනිමින් පවත්වන ලද හරිත සමාජ වැඩ පිළිබඳ මාර්ගගත දැනුවත් කිරීමේ වැඩසටහන	2021.09.27	67 සමාජ වැඩකරුවන්	- එම -
23	අම්පාර මධ්‍යස්ථානය විසින් මානසික සෞඛ්‍ය පදනම් එක්ව සෞඛ්‍ය නිළධාරීන් වෙනුවෙන් පවත්වන ලද ක්ලමථ කළමණාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	2021.09.13	187 සෞඛ්‍ය හා උපදේශන නිළධාරීන්	- එම -

24	මාර්ගගත ක්‍රමය යටතේ කොවිඩ් - 19 න් පිඩාවට පත් වූවන් සඳහා දුරකථන මාර්ග යටතේ පවත්වන ලද උපදේශන සේවාව	2021 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා	කොවිඩ් - 19 නිසා පීඩාවට පත් පුද්ගලයින් 135 දෙනෙකු සඳහා	නොමිලේ සිදු කරන ලද උපදේශන සේවාවකි.	
අය කිරීම් කරන ලද සහතික පත්‍ර සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන්					
25	ළමුන් කේන්ද්‍ර කර ගත් ප්‍රජා සංවර්ධනය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	2022.01.27 සිට මාස 09	19	209,000.00 -	
26	නවයෞවනයන් සමඟ වැඩ කිරීම පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන	2021.10.15 2021.10.22 2021.10.26	සාමාජිකයින් 69	මධ්‍යම පළාත් පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ගෙවන ලදි. 207,000.00	
27	මධ්‍යම පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීමකට අනුව පවත්වනු ලැබූ වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන	2021.11.30 2021.12.10 2021.12.14 2021.12.17 2021.12.21	30	150,000.00 * සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන සපයා ඇත.	
28	අධිකරණ පවුල් උපදේශන නිළධාරීන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන්	2021.08.28 – 18.09.2021 වැඩසටහන් 04	අධිකරණ පවුල් උපදේශන නිළධාරීන් 74	ආසියානු පදනම මගින් මූල්‍ය ප්‍රතිපාදන සපයන ලදි. 1,715,000.00 සම්පූර්ණ වියදම් - 134,200.00	
නොමිලේ පවත්වන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්					
29	උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සංශෝධනය කිරීම	01.01.2021 31.05.2021 07.06.2021	විෂය මාලා සංශෝධනය අවසන් කර ඇත. අධ්‍යයන නීතිමාලා සංශෝධනය	ප්‍රතිපාදන වෙන් කර නොමැත.	නිවසේ සිට රාජකාරී සිදු කිරීම.
30	නායකත්වය සහ වෘත්තීය සංවර්ධනය	2021 මාර්තු 30	ග්‍රාම නිලධාරී වසම් 40 - මීගමුව	නොමිලේ කෙටි කාලීන පුහුණු වැඩසටහන්	00
31	කොවිඩ් - 19 ආසාදිත ප්‍රජාවට මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ උපදේශන සේවා සැපයීම - ප්‍රගතිය	2021 දෙසැම්බර්	ප්‍රජා සාමාජිකයින් 46 දෙනෙකු සඳහා	ප්‍රතිපාදන වෙන් කර නොමැත.	ප්‍රතිපාදන වෙන් කර නොමැත.
32	ක්ලමථ් කළමනාකරණය හා ආකල්ප සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන - රන්න පුහුණු මධ්‍යස්ථානය	2021.09.29	තරුණ සංවර්ධන නිලධාරීන් 30 දෙනෙකු සඳහා	ප්‍රතිපාදන වෙන් කර නොමැත.	ප්‍රතිපාදන වෙන් කර නොමැත.
	සහභාගී වූ සමස්ත සංඛ්‍යාව (පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්) දුරකථන / මාර්ගගත උපදේශන සේවාලාභීන්		5,863 135		

ප්‍රතිපාදන වෙන් කළ මුදල රු. 1,500,000.00 මුළු වියදම රු. 946,295.00

2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව පුහුණු හා අධ්‍යනික ප්‍රගතිය 100% ලභා කර ගෙන ඇති අතර (ක්‍රියාකාරී සැලැස්මට අනුව පුහුණුවන්නන් 1,000 ක් පුහුණු කිරීමට සැලසුම් කළ ද වසර අවසානයේ 5,863 ක් පුහුණු කර ඇත.) මාර්ග ගත ක්‍රමය හරහා වැඩි වශයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ප්‍රවාහන, සංග්‍රහ මුදල් වෙනුවෙන් වෙන් කළ මුදල් වියදම් නොවූ බැවින් වෙන් කළ ප්‍රතිපාදන වලින් රු. 553,705.00 ක මුදලක් ඉතිරි විය.

මුදල් අයකරනු ලබන පාඨමාලාවන් (සති අනිතයේ පාඨමාලා)

අනු අංකය	පාඨමාලාවේ නම, මාධ්‍ය හා ස්ථානය	ආරම්භක දිනය අවසන් වන දිනය	සිසුන් සංඛ්‍යාව		2021 අධ්‍යනික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය			
			ලියාපදිංචි සිසුන්	සහභාගිවන සිසුන්	අධ්‍යයනික පාඨමාලාව වර්තමාන ප්‍රගතිය (එක් විෂයයක් සඳහා පැය 45	අය වැය	ලැබුණු සම්පූර්ණ මුදල	සමස්ත වියදම්	ඉතිරි මුදල
01	වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2018	2018.08.03 මාස 18	19	19	පාඨමාලාව අවසන් කොට ඇත. සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට නියමිතය.	1,122,000.00	1,071,000.00	785,332.66	285,667.34
02	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 සිදුව (සිංහල)	2019/02/17 2021.01.18 මාස 21	40	32	පාඨමාලාව අවසන් කොට ඇත. සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට නියමිතය.	2,040,000.00	1,935,000.00	1,162,981.19	772,018.81
03	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 සිදුව (දෙමළ)	2019/02/17 2021.01.18 මාස 21	41	29	පාඨමාලාව අවසන් කොට ඇත. සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට නියමිතය.	2,040,000.00	1,542,000.00	1,328,789.36	213,210.64
04	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 සිදුව (ඉංග්‍රිසි)	2019/02/17 2021.01.18 මාස 21	38	30	පාඨමාලාව අවසන් කොට ඇත. සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට නියමිතය.	1,836,000.00	1,549,000.00	1,169,828.07	379,171.93
05	උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව සිදුව 2019/2021 සිදුව (සිංහල)	2019/01/27 2020/12/30 මාස 21	30	28	පාඨමාලාව අවසන් කොට ඇත. සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට නියමිතය.	2,128,000.00	1,684,000.00	892,328,88	791,671.12
06	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 (මඩකලපුව) (A කණ්ඩායම)	2019/02/23 21/02/2020 මාස 21	44	40	පාඨමාලාව අවසන් කොට ඇත. සහතිකපත්‍ර ප්‍රදානය කිරීමට නියමිතය.	2,244,000.00	1,683,000.00	1,294,496.43	388,503.57
07	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 (මඩකලපුව) (B කණ්ඩායම)	2019/08/23 21/08/2020 මාස 21	44	35	අවසාන විභාග මණ්ඩලය පැවැත්වීමට නියමිතය.	2,244,000.00	1,252,000.00	865,705.66	386,294.34

08	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 (යාපනය)	09/06/2019 30/04/2021 මාස 21	51	44	ක්ෂේත්‍ර පුහුණුවට අනුයුක්ත කර ඇත.	2,601,000.00	2,151,000.00	1,390,013.72	760,989.28
09	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 (ප්‍රජා පාදක විශෝධන නිළධාරීන් සඳහා) කුරුණෑගල	10/06/2019 සිට මාස 21	57	57	ක්ෂේත්‍ර පුහුණුවට අනුයුක්ත කර ඇත.	7,515,500.00	5,671,500.00	4,173,208.42	1,498,291.58
10	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 (ප්‍රජා පාදක විශෝධන නිළධාරීන් සඳහා) රත්නපුරය	17/06/2019 සිට මාස 21	20	19	ක්ෂේත්‍ර පුහුණුවට අනුයුක්ත කර ඇත.				
11	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 (ප්‍රජා පාදක විශෝධන නිළධාරීන් සඳහා) මාතර	20/06/2019 සිට මාස 21	40	38	ක්ෂේත්‍ර පුහුණුවට අනුයුක්ත කර ඇත.				
12	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2021 - කිලිනොච්චිය	15/07/2019 සිට මාස 21	31	27	ක්ෂේත්‍ර පුහුණුවට අනුයුක්ත කර ඇත.	1,632,000.00	1,256,000.00	807,273.41	448,726.59
13	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2020 තලාව - සිංහල	24/08/2019 සිට මාස 21	45	33	ක්ෂේත්‍ර පුහුණුවට අනුයුක්ත කර ඇත.	2,295,000.00	2,009,000.00	1,161,331.42	847,668.91
14	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2020 - නුවර	2019/12/12 සිට මාස 21	38	38	දෙවන සෙමෙස්තර මාර්ගස්ථ ක්‍රමය යටතේ පන්ති කාමර දේශන පැවැත්වේ.	2,550,000.00	2,042,000.00	331,772.33	1,710,227.67
15	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2020 (පුත්තලම - දෙමළ මාධ්‍ය)	2019/12/07 සිට මාස 21	42	39	දෙවන සෙමෙස්තර මාර්ගස්ථ ක්‍රමය යටතේ පන්ති කාමර දේශන පැවැත්වේ.	2,142,000.00	1,639,000.00	787,806.82	851,193.18
16	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2019/2020 (අම්පාර - සිංහල මාධ්‍ය)	2019/11/30 සිට මාස 21	40	23	ක්ෂේත්‍ර පුහුණුවට අනුයුක්ත කර ඇත.	107,200,00			
17	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව –	2020.08.15 සිට මාස 21	44	44	පළමු සෙමෙස්තර මාර්ගස්ථ ක්‍රමය යටතේ පන්ති කාමර දේශන පැවැත්වේ.	2,346,000.00	1,894,000.00	1,620,082.28	273,917.72

	2020/2022 (කිලිනොච්චිය - දෙමළ මාධ්‍ය)								
18	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2020/2021 (රත්නපුරය - සිංහල මාධ්‍ය)	2020.08.28 සිට මාස 21	49	48	දෙවන සෙමෙස්තර මාර්ගස්ථ ක්‍රමය යටතේ පන්ති කාමර දේශන පැවැත්වේ.	2,448,000.00	2,149,000.00	1,413,000.00	736,000.00
19	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව – සීදුව –(සිංහල, දෙමළ හා ඉංග්‍රීසි)	07.03.2021 සිට 31.12.2022 දක්වා මාස 21	125	සිංහල 53 දෙමළ 43 ඉංග්‍රීසි 30	පළමු සෙමෙස්තරය අවසන් කර ඇත.	6,171,000.00	5,703,000.00	713,067,00	4,989,933.00
20	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2021 /22 (තලාව - සිංහල මාධ්‍ය)	2021.08.29 සිට මාස 21	57	57	පළමු සමාසික දේශන පවත්වා ගෙන යනු ලබයි.				
21	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අම්පාර - දෙමළ මාධ්‍ය)	2021.12.04 සිට මාස 21	55	55	පළමු සමාසික දේශන පවත්වා ගෙන යනු ලබයි.				
22	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (ත්‍රිකුණාමලය - දෙමළ මාධ්‍ය)	2021.04.24 සිට මාස 21	44	44	පළමු සෙමෙස්තර අවසන් විභාගය පවත්වා ඇත.				
23	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (නුවර - දෙමළ මාධ්‍ය)	2021.12.04 සිට මාස 21	57	57	පළමු සමාසික දේශන පවත්වා ගෙන යනු ලබයි.				
24	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (හැටන් - දෙමළ මාධ්‍ය)	ආරම්භ කිරීමට නියමිතයි.	19		සිසුන් ලියාපදිංචි වෙමින් සිටී.				
25	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (යාපනය - දෙමළ මාධ්‍ය)	2021.07.03 සිට මාස 21	44	44	පළමු සමාසික දේශන පවත්වා ගෙන යනු ලබයි.				
	සම්පූර්ණ සිසුන් සංඛ්‍යාව		**1095**	**1007**					

අනු අංකය	පාඨමාලාවේ නම, මාධ්‍ය හා ස්ථානය	ආරම්භක දිනය අවසන් වන දිනය	සිසුන් සංඛ්‍යාව		2021 අධ්‍යනික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය			
			ලියාපදිංචි සිසුන්	සහභාගි වන සිසුන්	අධ්‍යයනික පාඨමාලාව වර්තමාන ප්‍රගතිය (එක් විෂයයක් සඳහා පැය 45)	ලියාපදිංචි සිසුන්	සහභාගි වන සිසුන්	අධ්‍යයනික පාඨමාලාව වර්තමාන ප්‍රගතිය (එක් විෂයයක් සඳහා පැය 45)	ලියාපදිංචි සිසුන්
01	විශේෂ අධ්‍යාපනය සඳහා ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	2019.11.23 මාස 06	11	11	ක්ෂේත්‍ර පුහුණුව අවසන් කර ඇති අතර ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතය.	1,122,000.00	1,071,000.00	785,332.66	285,667.34

සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ හා ප්‍රකාශන අංශය

අ.අ	ව්‍යාපෘතියේ නම	ක්‍රියාකාරකම	ස්ථානය	වාර්ෂිකව වෙන් වූ මුදල (රු.)	භෞතික ප්‍රගතිය	මූල්‍ය ප්‍රගතිය	ප්‍රතිලාභීන්
01	ශ්‍රී ලංකා සමාජ වැඩ ජර්නලය Sri Lanka Journal of Social Work 2021 අර්ධ වාර්ෂික	අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය යටතේ සමාජ වැඩ ජර්නලය අර්ධ වාර්ෂිකව සකස් කර ඇත	ජාතික සමාජ සංවර්ධන ආයතනය	30,000.00	සමාජ වැඩ ජර්නලය අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත	*42,000.00	අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය භාවිතා කරන්නන්
02	ශ්‍රී ලංකා සමාජ සංවර්ධන ජර්නලය Sri Lanka Journal of Social Development 2021 අර්ධ වාර්ෂික	අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය යටතේ සමාජ සංවර්ධන ජර්නලය අර්ධ වාර්ෂිකව සකස් කර ඇත	ජාතික සමාජ සංවර්ධන ආයතනය	30,000.00	සමාජ සංවර්ධන ජර්නලය අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත.	18,000.00	අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය භාවිතා කරන්නන්
03	E-Journal අර්ධ වාර්ෂික	අධ්‍යයන කටයුතු මණ්ඩලයේ අනුමැතිය යටතේ අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීමට කටයුතු කිරීම	ජාතික සමාජ සංවර්ධන ආයතනය	30,000.00	අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත	27,000.00	අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය භාවිතා කරන්නන්

04	පුවත් හසුන කාර්තු (News Letter)	පුවත් හසුන මුද්‍රණය කර අවසන් කර ඇත	ජාතික සමාජ සංවර්ධන ආයතනය	200,000.00	පුවත් හසුන මුද්‍රණය කර අවසන් කර ඇත. අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත	**202,000.00	අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය භාවිතා කරන්නන්
05	පොත් එළිදැක්වීම Book Launch		ජාතික සමාජ සංවර්ධන ආයතනය	30,000.00	ZOOM තාක්ෂණය මඟින් පවත්වන ලදි	48,180.00	අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය භාවිතා 06කරන්නන්
06	ශිෂ්‍ය සමාජ වැඩ ජර්නලය Student Journal of Social Work 2021	තෝරා ගත් පර්යේෂණ වර්තා පලකිරීමට කටයුතු කිරීම	ජාතික සමාජ සංවර්ධන ආයතනය	30,000.00	අපගේ අන්තර්ජාල වෙබ් අඩවිය ඔස්සේ පලකිරීම කර ඇත	7,500.00	ශිෂ්‍යයින්, අධ්‍යයන කාර්යය මණ්ඩලය හා රාජ්‍ය හා රාජ්‍ය නොවන අනෙකුත් අදාළ පිරිස් හා පර්යේෂණ අංශයේ නියතු අය
07	පර්යේෂණ ක්‍රම චේදය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවේ විෂය නිර්දේශය සංවර්ධනය කිරීම		ජාතික සමාජ සංවර්ධන ආයතනය	50,000.00	පුහුණු දින දර්ශනයෙහි (Training Directory) පලකර ඇත	-	පර්යේෂකයින්, රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් හා ශිෂ්‍ය ප්‍රජාව
08	කොවිඩ් 19 වෛරසය වැළඳුනු ප්‍රජාව සුවපත්භාවයට පත් වූ පසු සමාජ අන්තර් සම්බන්ධතා පැවැත්වීමේදි මුහුණ දෙන මනෝ සමාජීය ගැටලු පිළිබඳ අධ්‍යයනය	දත්ත රැස්කිරීම,දත්ත ඇතුළත් කිරීම ,දත්ත සැලසුම් කිරීම හා වාර්තා ලිවීම	ගම්පහ මහ නගර සභාව	110,000.00	පර්යේෂණ මෙවලම් සකස් කිරීම, දත්ත එකතු කිරීම	-	මහජනතාව
09	කොවිඩ් 19 කාලය තුලදි සෞඛ්‍ය ආරක්ෂණය සහ අපද්‍රව්‍ය කළමණාකරණය සිදු කිරීමේ දී පරිසරයට ඇතිවන බලපෑම අනාගත සමාජීය ප්‍රතිවර්ථනය	දත්ත රැස්කිරීම,දත්ත ඇතුළත් කිරීම ,දත්ත සැලසුම් කිරීම හා වාර්තා ලිවීම	කොළඹ මහ නගර සභාව	110,000.00	පර්යේෂණ මෙවලම් සකස් කිරීම, දත්ත එකතු කිරීම		මහජනතාව

10	සමෘද්ධි නිෂ්පාදිත ගම්මාන වල සමාජ ,ආර්ථික තත්ත්වය සොයා බැලීමේ තක්සේරු අධ්‍යයනය 2021	දත්ත රැස්කිරීම,දත්ත ඇතුළත් කිරීම ,දත්ත සැලසුම් කිරීම හා වාර්තා ලීවීම	ගාල්ල/මාතර	600,000.00	පර්යේෂණ වාර්තාව මුද්‍රණය කිරීම	505,291,50	සමෘද්ධි අමාත්‍යාංශය
11	සමාජ ප්‍රතිපත්ති පිළිබඳ ශාස්ත්‍රීය ප්‍රකාශනය	පර්යේෂණයේ දත්තයන් සමාජ ගත කිරීම හා නව පර්යේෂණ සඳහා විද්‍යාර්ථයින් යොමු කිරීම	ජාතික සමාජ සංවර්ධන ආයතනය	170,000.00	පිටපත් 500 ක් මුද්‍රණය කිරීම	170,000.00	පර්යේෂකයින් ,රාජ්‍ය හා රාජ්‍ය නොවන නිලධාරීන් හා ශිෂ්‍ය ප්‍රජාව

සමාජ සේවා විද්‍යාලය

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පැරණිතම අංශය සමාජ සේවා විද්‍යාලය වන අතර එම අංශය මඟින් වෘත්තීය සමාජ වැඩ පිළිබඳ උපාධි පිරිනමනු ලබයි ඒ අනුව ශ්‍රී ලංකාවේ වෘත්තීය සමාජ වැඩ උපාධිය දෙනු ලබයි. දැනට සමාජ සේවා විද්‍යාලය මඟින් ප්‍රධාන වැඩසටහන් හතරක් ක්‍රියාත්මක වකරනු ලබයි. එනම්, සමාජ වැඩ එක් අවුරුදු ඩිප්ලෝමා, සමාජ වැඩ උසස් ඩිප්ලෝමා, සමාජ වැඩ උපාධිය, සමාජ වැඩ පශ්චාත් උපාධිය ආදී වශයෙන් එම පාඨමාලා හැදින්විය හැකිය. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ අරමුණු හා පරමාර්ථ පහත පරිදි සඳහන් කළ හැකිය.



ජාතික සමාජ සංවර්ධන ආයතනයේ 2021 උපාධි ප්‍රධානෝත්සවය

අරමුණු හා පරමාර්ථ

1. සමාජ වැඩ අධ්‍යාපනය පිළිබඳ නව වැඩසටහන් හඳුන්වා දීම
2. දැනට ක්‍රියාත්මක අධ්‍යයන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම.
3. සමාජ වැඩ අධ්‍යාපනය තුළ තොරතුරු තාක්ෂණය හා ඉංග්‍රීසි භාෂාව භාවිතය වැඩි දියුණු කිරීම.
4. වෘත්තීය පිළිගැනීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
5. සමාජ සංවර්ධනයට සහ සමාජ සවිබලගැන්වීම සඳහා සමාජ වැඩ වෘත්තිකයන් බිහි කිරීම.

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හැදින්වීම

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ අරමුණු වනුයේ වෘත්තීමය සුදුසුකම් සහ කළමනාකාරීත්වය දක්ෂතාවයක් සහිත මිනිස් බල සම්පත පුහුණු කිරීම මඟින් සමාජ සුභසාධනය සමාජ සංවර්ධනය දිරිගැන්වීම සඳහා අවශ්‍ය වෘත්තිකයන් බිහි කිරීමයි. මෙම වැඩසටහන සකස් කොට ඇත්තේ සමාජ වැඩ පිළිබඳ උසස් දැනුමත්, ප්‍රායෝගික පුහුණුවීම් ආදිය මූලික කරගෙන සහභාගිවන්නන් තුළ දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය තුළින් ඔවුන් සමාජ සංවර්ධන ක්ෂේත්‍රයේ නියමුවන් ලෙස ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී ඔවුන්ගේ සක්‍රීය දායකත්වය ලබාගැනීම සඳහාය.

පාඨමාලාවේ විෂය අන්තර්ගතය

ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවේ විෂය අන්තර්ගතය සැකසීමේදී සමාජීය විද්‍යාවන් මෙන්ම සමාජ වැඩ විෂයට අදාළ ක්‍රමෝපායන් ඇතුළත්ව විෂය නිර්දේශය සකස් කර ඇති අතර, එහිදී විශේෂයෙන්ම න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික දැනුම ලබාගැනීම සඳහා ක්ෂේත්‍ර පුහුණුවීම් දෙකක්ද පර්යේෂණාත්මක නිබන්ධනයක් සකස් කිරීමත් සිසුන් විසින් සිදුකළ යුතුය. ඒ අනුව සමාජ වැඩ සඳහා සමාජ විද්‍යාව, සමාජ වැඩ සඳහා මනෝ විද්‍යාව, සමාජ වැඩ දර්ශනය සහ මූලිකාංග, ශ්‍රී ලංකා සමාජය අවබෝධ කරගැනීම, ශ්‍රී ලංකාවේ සමාජ සුභසාධන වැඩසටහන් ගෝලීයකරණය හා සමාජ සුභසාධනය, සමාජ වැඩ සහ මානව අයිතිවාසිකම්, සමාජ වැඩ කළමනාකරණය, සමාජ වැඩ ප්‍රතිපත්ති යන විෂයයන් මෙම විෂය නිර්දේශයට ඇතුලත්ය. එමෙන්ම මූලික ක්ෂේත්‍ර පුහුණුවීම් ලෙස ප්‍රජාව හා කණ්ඩායම් සමඟ වැඩ කිරීමෙන් ප්‍රායෝගික දැනුම, කුසලතා ලබාගැනීමට සිසුන්ට අවස්ථාව සපයා ඇත.

මෙම පාඨමාලා Sri Lanka Qualification Frame Work අනුව සකස් කර ඇති අතර, ජාත්‍යන්තර මට්ටමේ පිළිගැනීමක් මෙම උපාධියට පවතී. එබැවින් අප ආයතනයේ සමාජ වැඩ ශාස්ත්‍රපති උපාධිය හදාරනු ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විදේශීය රැකියා ලබාගැනීම සඳහා ද අවස්ථාව ලැබී ඇති අතර එය අප ආයතනය ලබාත් ජයග්‍රහණයක් ලෙස සැලකිය හැකිය.

සමාජ වැඩ පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය

සමාජ වැඩ පිළිබඳ උපාධිය වසර හතරක පූර්ණකාලීන පාඨමාලාවකි. එය සමාසික 08 කින් සමන්විත වන අතර, පංති කාමර දේශන හා සමගාමී ක්ෂේත්‍ර පුහුණුවීම් තුනකින් යුක්ත වේ. විශේෂයෙන්ම සමාජ වැඩ ශාස්ත්‍රවේදී උපාධිය ශ්‍රී ලංකාවේ ඇති අනෙකුත් විශ්වවිද්‍යාලවලින් පවත්වනු ලබන උපාධි පාඨමාලාවලට වඩා සුවිශේෂී වන්නේ න්‍යායාත්මක දැනුම පමණක් නොව ප්‍රායෝගික පුහුණුවීම්වලින් ද යුක්ත වන නිසාය.

මෙම ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය සමාජීය විද්‍යාවන්ගේ විෂය අන්තර්ගතයන් මෙන්ම සමාජ වැඩවලට පමණක් සුවිශේෂී වූ ක්‍රමෝපායන්වලින් යුක්ත වන අතර, සිසුන්ට ඒ පිළිබඳ පුළුල් දැනුමක් අධ්‍යයන කාලය තුළදී ලබා දෙනු ලබයි.

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ සේවා විද්‍යාලයේ උපාධිය හැදෑරූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පහත සඳහන් ආකාරයේ රැකියා අවස්ථා සඳහා හිමිකම් ලැබෙන බව සඳහන් කළ හැකිය.

උපාධිධාරීන් නියුක්ත රැකියා අවස්ථාවන්

රාජ්‍ය අංශයේ රැකියා

- සමාජ වැඩ උපදේශක - වෛද්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- රේගු නිලධාරීන්
- සංවර්ධන සහකාර
- පරිවාස නිලධාරීන්
- ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්
- උපදේශක
- ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපන සේවය
- මනෝ විද්‍යාත්මක සමාජ වැඩ උපදේශක

රාජ්‍ය නොවන අංශය - ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමාජ වැඩ වෘත්තීකයන් හට විශාල ඉල්ලුමක් පවතී.

ඒ අනුව පහත සඳහන් රැකියා අවස්ථාවන් අප ආයතනයෙන් උපාධි ලැබූ උපාධිධාරීන්ට ලැබී ඇත. එය පහත පරිදි වේ.

- ව්‍යාපෘති කළමනාකරු / නිලධාරීන්
- වැඩසටහන් නිලධාරීන්
- උපදේශක

පෞද්ගලික අංශය - සමාජ වගකීම් සම්බන්ධීකාරක
- උපදේශක
- මානව සම්පත් කළමනාකරු/ නිලධාරීන්

මීට අමතරව විදේශීය ශිෂ්‍යත්වයක් ලබාගෙන සිසුන් NORAD, AUS/AID, Commonwealth, Indian Government Scholarship වැනි ආයතනවලින් උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා විදේශ ගත වී ඇත. මෙම සිසුන්ට විදේශීය වශයෙන් වැඩි ඉල්ලුමක් තිබෙන අතර, ඔවුන්ට ඉහළ මට්ටමේ රැකියා අවස්ථාවන් ලැබී ඇත.

විෂය බාහිර ක්‍රියාකාරකම්

1.ලෝක සමාජ වැඩ වෘත්තිකයින්ගේ දිනය සෑම වසරකම මාර්තු 16 වෙනි දිනට යෙදී ඇත

එම වැඩසටහන් සඳහා සහභාගි වූ සම්පත්දාරී පුද්ගලයින් පහත අයුරින් දැක්විය හැකිය.

දිනය 2021 මාර්තු 09 වන දින









මම නිසා අපි : සමාජ සහයෝගීතාව සහ ගෝලීය සම්බන්ධතාවය ශක්තිමත් කිරීම

ලෝක සමාජ වැඩ වෘත්තිකයින්ගේ දිනය සෑම වසරකම මාර්තු 16 වෙනි දිනට යෙදී ඇත. මෙවර සමාජ වැඩ දිනයේ තේමාව වනුයේ I am because We are : Strengthening Social Solidarity and Global Connectedness මම නිසා අපි : සමාජ සහයෝගීතාව සහ ගෝලීය සම්බන්ධතාවය ශක්තිමත් කිරීම යන්නයි. මෙය අප්‍රිකානු පරමාදර්ශීය ඇගයුමක් වන උබන්ටු (Ubuntu) පදනම් කරගෙන ගොඩනැගුණු තේමාවකි. එය අප්‍රිකානු කලාපයේ රටවල්වලට පමණක් නොව අනෙක් රටවල්වලට ද වැදගත් වන්නේ ඇයි? මම නිසා අපි කවුරුන්ද? යන අගනාකම කෙරෝනා වැනි අධිවසංගත තත්වයක් කළමණාකරණය කිරීමේ දී වැදගත් වන්නේ ඇයිද ? යන්න අප දිගින් දිගටම කල්පනා කළයුතුයි. කොරානා අධිවසංගතය නිසා අපිට පෙන්වනු ලැබූ අලුත් පාඩම් පිළිබඳ නැවත නැවත සිතා බලමින් අනාගත ලෝකයේ මුහුණ දීමට සිදුවන අභියෝග සඳහා පෙර සුදානම වැදගත් වේ.

ලෝක සමාජ වැඩ දිනය මූලික කරගෙන 2021 මාර්තු 09 වන දින ජාතික සමාජ සංවර්ධනය සහ මොරටුව සර්වි ආයතනය සමඟ සම්බන්ධ වී කොවිඩ්-19 සෞඛ්‍ය ව්‍යවසනයෙන් අත් මදීම සඳහා ප්‍රජාවක් ලෙස කටයුතු කලයුත්තේ කෙසේද යන්න ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්විය. එයට ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ෂාමිණි අත්තනායක මහත්මිය ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයත්, කථිකාචාර්යවරුන් සහ ප්‍රජා නායකයින් සහභාගී විය. ඊට අමතරව සමෘද්ධි ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් හේමා පෙරේරා මහත්මිය ද සහභාගී වූ අතර මොරටුව සර්වි ආයතනයේ සංජීව ද මෙල් මහතා මෙහි මූලික කටයුතු සංවිධානය කරන ලදී.



සමාජ වැඩ දිනයට සමගාමීව මාර්තු 16 වෙනි දින 9.30 සිට 11.30 දක්වා උබන්ටු මම නිසා අපි කවුරුන්ද යන තේමාව ඔස්සේ වෙබිනාර් සාකච්ඡාව ජාතික සමාජ සංවර්ධන ආයතනයේ දී සිදු කරන ලදී. එයට සම්පත් දායකත්වය සපයන ලද්දේ කැනඩාවේ ටොරොන්ටෝ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය සරත් චන්ද්‍රසේකර මහතා විසිනි. ශ්‍රී ලංකා සමාජ වැඩ වෘත්තිකයින්ගේ සංගමය ද අන්තර් ජාතික සමාජ වැඩ සම්මේලනය ද එක්ව සංවිධානය කරන ලද මෙම වැඩසටහන සඳහා ලංකාවේ මෙන්ම විදේශීය සමාජ වැඩ වෘත්තිකයින් ශිෂ්‍ය සමාජ වැඩ වෘත්තිකයින්, මෙන්ම සමාජ වැඩ ආශ්‍රිතව සමාන ක්ෂේත්‍රවල වැඩ කරන වෘත්තිකයින් ද සහභාගී විය.

මානව වාසභූමීවල සේවා සැපයීම 2021

සමාජ සේවා විද්‍යාලයේ සමාජ වැඩ උපාධිය හදාරණ තෙවන වසර සිසුන්ට මානව වාසභූමීවල සේවා සැපයීම නමින් ග්‍රාමීය කඳවුර විෂය නිර්දේශයට අනුකූලව අනිවාර්යෙන්ම කළයුතු ක්ෂේත්‍ර වැඩසටහනක් පවතී. මෙවර එම වැඩසටහන සඳහා සහභාගී වූයේ සමාජ වැඩ උපාධි පාඨමාලාවේ 2017/2018 අධ්‍යයන වර්ෂයේ ශිෂ්‍ය කණ්ඩායමකි.මෙම වැඩසටහන මාර්තු 24 සිට අප්‍රේල් 04 දක්වා හලාවත දී පවත්වන්නට යෙදිණි. හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත්වන ග්‍රාම නිළධාරී වසම් 12 ක් ආවරණය වන පරිදි මේ වැඩසටහන පවත්වන ලදී. සිසුන් දින 10 ක් පුරා නේවාසිකව සිටිමින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ වසම් වල සේවා සැපයීම පිළිබඳව සිසුන් අධ්‍යයනයක යෙදෙන අතර රජයෙන් සැපයෙන සේවාවන් කෙතෙක් දුරට ප්‍රජාව වෙතට ලඟා වෙනවාද? ඒසේ නොමැතිනම් ඒවාට ඒවාට බලපාන හේතු මොනවාද සහ ජනතාවට ඒ පිළිබඳව ඇති අවබෝධය පිළිබඳ අධ්‍යයනයක් සිදුකරනු ලබයි. එමගින් ප්‍රජාව හා ප්‍රාදේශීය මට්ටමින් කටයුතු කරනු ලබන ක්ෂේත්‍ර නිලධාරීන් හට ඇති ගැටළු පිළිබඳව සාකච්ඡා කරන අතර සමාජ වැඩ මැදිහත්වීම සහ ගැටළු නිරාකරණය පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරවීම සිදුකරනු ලබයි.





හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාල ය ද හලාවත දිමුතු පදනම ද, සමාජ සේවා විද්‍යාලයේ තෙවන වසර 2017/2018 ශිෂ්‍ය කණ්ඩායමට මානව වාසභූමි වල සේවා සැපයීම සාර්ථක කරගැනීම සඳහා උපරිම සහයෝගය ලබා දෙන ලදී.

මාර්ගස්ත ක්‍රමය යටතේ සිදුකළ වෙසක් බැති ගී වැඩසටහන

සමාජ සේවා විද්‍යාලයේ සමාජ වැඩ උපාධිය හදාරණ 2019/20 කණ්ඩායම් විසින් සංවිධානය කරන වෙසක් බැති ගී ප්‍රසංගයක් මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ පවත්වන ලදී. කොරෝනා වසංගතය නිසා භෞතිකව වැඩසටහන් කිරීමට නොහැකි වුව ද රෝ බිය දුරලමු සදහම් සමරමු වෙසක් බැති ගී සරණිය නමින් සිසුන් මෙම වැඩසටහන ඉදිරිපත් කරන ලදී.

2021 වර්ෂයේ දී සිසුන් සමඟ සිදුකළ වෙබිනාර් වැඩසටහන්

01.සමාජ ගැටලු විසඳීම සදහා සෞම්‍ය මෙවලම් යොදා ගැනීම සහ කලාවේ භාවිතය පිළිබඳ වෙබිනාර් සංවාදය



සමස්ත සමාජයම වෙලා ඇති සමාජ ගැටලු නිසා තනි පුද්ගලයින්, කණ්ඩායම්, ප්‍රජාවන්ට සිදුවන ප්‍රතිශේදනාත්මක බලපෑම අතිමහත්ය. ඒ අතර පරාධීන චින්තනය, යැපුම් මානසිකත්වය, රාමුගත චින්තනය, නිදැහැලි බව, අලුත් දේවල් ඉගෙන නොගැනීම, කිසිදු උත්සාහයක් නොමැතිව ජීවිතය අතහැරීම, අනෙකාට ගරු නොකිරීම සහ වටිනාකමක් ලබා නොදීම වැනි දෑ එදිනෙදා ජීවිතයේ දී අපට නිතර අසන්නට ලැබෙයි. මෙම සිතුවිලි නිසාම ඇතිවන හැසිරීම් රටාවන් ද සමාජයේ නව සමාජ ගැටලු නිර්මාණය කිරීමට ද හේතු වේ. අද බොහෝ මාධ්‍ය ක්‍රියාකරන්නේ ද ස්වාධීන ජන මතයක් නිර්මාණය කිරීමට බලපෑමක් නොවන බව පෙනී යයි. එමගින් රටක් වශයෙන් දිගුකාලීනව ඇතිවන බලපෑම සුළුපටු නොවන අතර ජනවර්ගික සාමය සහ සංහිදියාවට අවස්ථාව අප අතරෙන් ගිලිහි තිබෙන්නේ මෙවැනි වටපිටාවක් තුළයි.

කලාව හා නිර්මාණශීලිත්වය තුළින් සමාජ ගැටලු වලට විසඳුම් සෙවීම, ගැටලු සහිත පුද්ගලයින් සවිබල ගැන්වීම සහ සමාජය සුභවාදී දිශානතියකට පරිවර්තනය කිරීම, මෙවැනි සමාජ තත්වයන් වෙනස් කිරීමට අනිවාර්යෙන්ම මැදිහත් වීම අවශ්‍ය වේ. මෙම ගැටලු සදහා නිර්මාණශීලී ප්‍රවේශයන් අනුගමනය කිරීම වඩාත් සුදුසු වේ.

මෙම වෙබිනර් සාකච්ඡාව මගින් සමාජ ගැටලුවලට විසඳුම් ලෙස සෙම්‍ය මෙවලම් යොදා ගැනීම සහ කලාවේ භාවිතයපිළිබඳ වැඩි අවධානයක් යොමුකරන ලදී. ඒ අනුව සමාජ වැඩ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් 2021 ජනවාරි 09 දින සංවිධානය කරන ලදී. ඒ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය ජගත් බණ්ඩාර පතිරගේ සබරගමුව විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ ආචාර්ය චම්පා ද සිල්වා ගීත රචක රවි සිරිවර්ධන දකුණු ආසියා විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂිකා අනුෂ්කා කහඳගමගේ සහභාගී විය.

අලි මිනිස් ගැටුම පිළිබඳ සමාජ දේශපාලනික වෙබිනාර් සාකච්ඡාව



අලි මිනිස් ගැටුම පිළිබඳ සමාජ දේශපාලනික කථිකාවතක් 2021 ජනවාරි 13 වන දින පවත්වන ලදී. මෙහිදී සමාජ ගැටලුවලට මැදිහත් වීමේ අරමුණින් අලි මිනිස් ගැටුම් සම්බන්ධයෙන් ශිෂ්‍ය සමාජ වැඩකරුවන් විසින් 2021.02.13 වන දින සවස 6.00ට සංවිධානය කරන ලදී. ඒ සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය මොහොමඩ් මහීස් වනජීවී සංරක්ෂණ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් චන්දන සූරියබණ්ඩාර සහ කැනඩාවේ ටොරොන්ටෝ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සරත් චන්ද්‍රසේකර සහභාගී විය. මෙම සාකච්ඡාවෙන් අලි මිනිස් ගැටුම ඇති වීමට බලපෑ හේතු සහ ගැටුම් වළක්වා ගැනීමට ප්‍රජාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග හා ප්‍රතිපත්තිමය වශයෙන් වගා සංරක්ෂණ ක්‍රම පිළිබඳව ගතයුතු ක්‍රියාමාර්ග සාකච්ඡාවට භාජනය විය.

වෙබිනර් සාච්ඡාව - ආපදා කළමනාකරණයේදී සමාජ වැඩ වෘත්තිකයාගේ මැදිහත් වීම.

ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් **සෞභාග්‍යා සතිය** මූලික කරගනිමින් පැවති මාර්ගගත සාකච්ඡාවේ ප්‍රධාන තේමාව වූයේ ආපදා කළමනාකරණය සඳහා සමාජ වැඩ වෘත්තිකයාගේ මැදිහත්වීම කෙබඳු ආකාරයකින් සිදුවිය යුතුද යන්න විමසා බැලීමයි. මෙම වැඩසටහන 2021 ජූලි 06 වන දින සවස 7.00 සිට 9.00 දක්වා පැවැත්විය. මේ සඳහා සමාජවැඩ වෘත්තිකයන් සහ සමාජවැඩ ශිෂ්‍යයන්ද සහභාගී වූ සහභාගී විය.

මෙම සාකච්ඡාව මගින් ස්වාභාවික ආපදා සහ මිනිසා විසින් සිදුකරනු ලබන ආපදා වලදී සමාජ වැඩ වෘත්තිකයන්ගේ කාර්ය භාරය පිළිබඳව අවධානය යොමුකළ යුතු අතර එහිදී ප්‍රතිකාරාත්මක නිවාරණාත්මක සහ සංවර්ධනාත්මක ප්‍රවේශයන් ඔස්සේ ආපදා කළමනාකරණ කරගතයුතු ආකාරය සම්බන්ධයෙන් ප්‍රජාව දැනුවත් කිරීමත් සමාජ වැඩ වෘත්තිකයා මැදිහත් කරුවකු ලෙස ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳවත් සාකච්ඡාවට භාජනය විය.

පුහුණු අංශය



හැඳින්වීම

2004 වර්ෂයේදී ස්ථාපනය කරනු ලැබූ පුහුණු අංශය, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ආයතනික ව්‍යුහයේ ප්‍රධාන අංශ හතර අතුරින් එකක් වශයෙන් හැඳින්විය හැකිය. මෙම අංශය පුහුණු කිරීමේ අධ්‍යක්ෂකවරියක යටතේ ක්‍රියාත්මක වේ. ජ්‍යෙෂ්ඨ පුහුණු කිරීමේ නිළධාරිනියන් දෙදෙනෙකු සහ දෙවන ශ්‍රේණියේ පුහුණු කිරීමේ නිළධාරීන් / නිළධාරිනියන් 08 දෙනෙකු මෙම අංශය තුළ සේවය කරනු ලබයි. මීට අමතරව කළමණාකාර සහකාර I එක් නිළධාරිනියක්, කළමණාකාර සහකාර II නිළධාරිනියන් දෙදෙනෙකු සහ කළමණාකාර සහකාර III එක් නිළධාරියෙකු ද මීට අමතරව කාර්යාල සහායකවරයෙකු ද මෙම අංශයට අනුයුක්තව සේවය කරයි.

පුහුණු අංශයේ අරමුණු :

1. විවිධ ක්ෂේත්‍රයන්හි සහ අදාළ අංශයන්හි පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම
2. රටෙහි පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ඊට අනුකූල වන පරිදි මානව සම්පත් පුහුණු කිරීම
3. අවශ්‍යතා තක්සේරුව මගින් පුහුණු අවශ්‍යතා සහිත අංශ හඳුනා ගැනීම
4. සේවාලාභීන්ගේ අවශ්‍යතාවන්ට අනුකූලවන පරිදි පුහුණු වැඩසටහන් සංවිධානය සහ ක්‍රියාත්මක කිරීම
5. පුහුණු වැඩසටහන්වලට අදාළ පාඨමාලා අන්තර්ගතයන් සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය මගින් උපදේශනය පිළිබඳ උපාධි පාඨමාලා සහ පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීමට නියමිත අතර, පුලුල් ක්ෂේත්‍ර ගණනාවක් පදනම් කරගනිමින් පුහුණු කිරීමේ වැඩසටහන් ද සංවිධානය කරනු ලැබේ. එහිදී දීර්ඝ කාලීන සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් සහ පාඨමාලාවන් මෙන්ම අනෙකුත් වෘත්තීය පාඨමාලාද සංවිධානය කරනු ලැබේ. ඒ අතර සංවිධානය කරනු ලබන දීර්ඝ කාලීන පුහුණු වැඩසටහන් පහත ආකාර වේ.

- උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- ළමා ආරක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- සමාජ රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- ප්‍රජාපාදක විශෝධනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

- උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- ළමා පාදක ප්‍රජා සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව
- විශේෂ අධ්‍යාපනය ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

මෙම වැඩසටහන් සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන මාධ්‍ය ත්‍රිත්ත්වයෙන් ම පැවැත්වීමේ හැකියාව පවතින අතර, අදාළ අධ්‍යයනික වැඩසටහනට පවතින ඉල්ලුමට අනුව භාෂා මාධ්‍යය තීරණය කෙරේ.

පුහුණු අංශය වෙත ලැබෙන ඉල්ලුම මත පදනම්ව පහත ආකාරයේ කෙටිකාලීන පුහුණු වැඩසටහන්ද සංවිධානය කරනු ලැබේ.

- සතුටු පවුල
- උපදේශනය තුළ තක්සේරුකරණය
- ආතතිය සහ මනෝවිද්‍යාත්මක උපදේශනය
- අනපේක්ෂිත ගැබ්ගැනීම් සහ උපදේශනය
- සමාජ හීතිකාව කළමණාකරණය කිරීම
- උපදේශන මැදිහත්කරණ ක්‍රමශිල්ප
- විශෝධන සේවා හා බැඳුනු උපදේශනය
- මත්ද්‍රව්‍ය සඳහා උපදේශනය
- ළමා සංවර්ධනය
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් වෙනුවෙන් සමාජ වැඩ මැදිහත්කරණය
- ව්‍යාපෘති ලිවීම සඳහා වැඩමුලු
- ප්‍රජා ව්‍යාපෘති කළමණාකරණය සඳහා වැඩමුලු
- වැඩිහිටි රැකවරණය සඳහා උපදේශන මැදිහත්කරණය
- දුගීබව අවම කිරීමේ ක්‍රමෝපාය සහ තිරසාර ජීවිකා සංවර්ධනය
- ගැටුම් නිරාකරණය සඳහා ප්‍රජා සංවර්ධනය සහ ප්‍රජා මූල කළමණාකරණය
- ධාරිතාව ගොඩනැවීමේ පුහුණු වැඩසටහන්

2021 වර්ෂයේදී පුහුණු අංශය මගින් පැවැත්වූ අධ්‍යයන පාඨමාලා

ඩිප්ලෝමා පාඨමාලා

1. උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

හැඳින්වීම

උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව, සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම ඩිප්ලෝමා පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන්ට අනුකූල වන පරිදි කොළඹ මධ්‍යස්ථානය කේන්ද්‍ර කරගනිමින් සැලසුම්කොට පවත්වාගෙන යයි.

ඉලක්කය

දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සෞඛ්‍ය සහිත මනා පරිවයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම

අරමුණු

- උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම
- උපදේශන වෘත්තිකයන්ගේ උසස් වෘත්තීය කුසලතා පුළුල් කිරීම
- උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව වර්ධනය කිරීම

මාධ්‍යය - සිංහල

කාල සීමාව

මාස 21කි. මෙම පාඨමාලාවෙහි මාස 03ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ. (සති අන්ත පාඨමාලාවකි)

පාඨමාලා ව්‍යුහය

සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි,

දේශන - පැය 405 සහ ක්ෂේත්‍ර පුහුණුව - පැය 150 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 555කි.

උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පහත සංරචකයන්ගෙන් සමන්විත විය.

- පාඨමාලා ඒකක 09
- ක්ෂේත්‍ර පුහුණුව

2021 වර්ෂය තුළ උසස් ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් 2019.01.27 වන දින මෙම පාඨමාලාව ආරම්භ කර ඇත. මේ වනවිට උසස් ඩිප්ලෝමා පාඨමාලාවේ සිසුන් ක්ෂේත්‍ර පුහුණුව සඳහා අනුයුක්ත කර ඇත.

2. උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය විසින් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සති අන්ත අධ්‍යයන පාඨමාලාවක් වශයෙන් පවත්වාගෙන යනු ලැබේ. මෙම පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන්ට (SLQF) අනුකූලවන පරිදි සකස්කර ඇත.

ඉලක්කය

දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිවයන්ගෙන් යුතු වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම

අරමුණු

- උපදේශන ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක බවින් හෙබි වෘත්තිකයන් බිහිකිරීම

- උපදේශන වෘත්තිකයන්ගේ උසස් වෘත්තීය කුසලතා පුළුල් කිරීම
- උපදේශන වෘත්තිකයාගේ මැදිහත්වීමේ හැකියාව වර්ධනය කිරීම

මාධ්‍යය

සිංහල/දෙමළ/ඉංග්‍රීසි

කාල සීමාව

මාස 21කි. මෙම පාඨමාලාවේ මාස 03ක ක්ෂේත්‍ර පුහුණුවක් අන්තර්ගත වේ. (සති අන්ත පාඨමාලාවකි)

පාඨමාලා ව්‍යුහය

සම්පූර්ණ සම්මාන ඒකක (credit) 30කි, දේශන පැය 405 සහ ක්ෂේත්‍ර පුහුණු පැය 135 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 540 කි.

2021 වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වූ ස්ථාන

1. ජාතික සමාජ සංවර්ධන ආයතනය, සීදුව ප්‍රධාන මධ්‍යස්ථානය (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය)
2. ප්‍රජා පාදක විශෝධන නිළධාරීන් සඳහා - මාතර, කුරුණෑගල හා රත්නපුර
3. තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය
4. අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය
5. රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
6. කුරුණෑගල
7. නුවර (දෙමළ මාධ්‍ය)
8. පුත්තලම (දෙමළ මාධ්‍ය)
9. මඩකලපුව පළාත් සභා පරිපාලන මධස්ථානය (A සහ B යන කණ්ඩායම්)
10. යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
11. කිලිනොච්චිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සතියේ දින එක් පාඨමාලාවක් හා සති අන්ත එක් පාඨමාලාවක්)

මේවන විට 2022 වර්ෂය සඳහා සීදුව (සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය), රන්න, තලාව, කුරුණෑගල, නුවර (දෙමළ මාධ්‍ය), හැටන් (දෙමළ මාධ්‍ය) සහ අම්පාර (සිංහල හා දෙමළ මාධ්‍ය) ප්‍රදේශයන්හි උපදේශනය පිළිබඳ නව ඩිප්ලෝමා පාඨමාලා ආරම්භ කිරීමට සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර තිබේ. මීට අමතරව සීදුව ප්‍රධාන මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගනිමින් උපදේශනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් (සිංහල මාධ්‍ය) ආරම්භ කිරීම සඳහා ද සම්මුඛ පරීක්ෂණය පවත්වා ඇත.

3. වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

හැඳින්වීම

වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව නිර්මාණය කරන ලද්දේ වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණයට අදාල ක්ෂේත්‍ර තුළ තම වෘත්තීය සංවර්ධනය ඇති කර ගැනීමට අපේක්ෂිත පුද්ගලයින්,

දැනටමත් මෙම ක්ෂේත්‍රයතුළ රැකියාවෙහි නියලෙන, තම වෘත්තීය මාවත පුළුල් කරගැනීමට අපේක්ෂිත පුද්ගලයින් පදනම් කරගෙනය. වයස්ගත වෙමින් පවතින සමාජය විසින් නිර්මාණය කරනු ලබන නව අවස්ථාවන්ට අනුරූපීයව අර්ථාන්විත වෘත්තීය වෙනස්කම් ඇති කිරීමේ අරමුණින් මෙම පාඨමාලාව පිරිනමනු ලැබේ. අන්තර්විෂයික පාඨමාලාවක් වශයෙන් මෙය සම්පූර්ණ කිරීමේදී, ශිෂ්‍යයින් විසින් දීර්ඝකාලීන හා සෞඛ්‍යය සම්පන්න ජීවිතයක් ගතකිරීම සඳහා ගැටලු විසඳීම සහ කුසලතා ඇතිකිරීමට අවැසි අවශ්‍යතාවන්ගෙන් සන්නද්ධවීම අපේක්ෂිතය. වැඩිහිටි රැකවරණ සේවා ක්ෂේත්‍රය තුළ ශිෂ්‍යයින්, තනි පුද්ගල වෘත්තීය මාවත සංවර්ධනය කර ගැනීමට මෙය උපකාරී වේ.

වෘද්ධ විද්‍යාව හා වැඩිහිටිරැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන්ට අනුකූල වන පරිදි (SLQF)සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ තත්ත්ව පරීක්ෂණ ඒකකය (Quality Assurance Unit)පිළිබඳ අවධානය යොමු කරමින් අර්ධකාලීන වැඩසටහනක් වශයෙන්, ශ්‍රී ලංකාව මගින් පිරිනමනු ලබන ජාතික සහ ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් සැකසීමේ අරමුණින් වර්ධනය කර ඇත.

ඉලක්කය

දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම සහිත මනා පරිවයන්ගෙන් යුතු වෘද්ධ විද්‍යාව හා වැඩිහිටි රැකවරණය විෂයෙහි කටයුතු කිරීමට බලාපොරොත්තුවන විද්වද් වෘත්තිකයන් පිරිසක් බිහි කිරීම හා මෙම ක්ෂේත්‍රයේ වැඩකිරීමට කැමැත්තක් දක්වන පුද්ගලයින්ගේ සිය වෘත්තිය ධාරිතාව සංවර්ධනය කිරීම

අරමුණු

- රැකබලා ගන්නන්ගේ ක්ෂේත්‍රය තුළ ගුණාත්මක බවින් පිරි වෘත්තිකයන් බිහිකිරීම
- වැඩිහිටියන් පිළිබඳ ක්ෂේත්‍රයේ නියැලෙන වෘත්තිකයන්ගේ වෘත්තීය කුසලතා පුළුල් කිරීම
- වෘත්තිකයන්ගේ මැදිහත්වීමේ හැකියාව වර්ධනය කිරීම

මාධ්‍යය : සිංහල

කාල සීමාව : මාස 18

පාඨමාලා ව්‍යුහය:

සම්පූර්ණ සම්මාන ඒකක (credit)30කි, දේශන-පැය 405 සහ ක්ෂේත්‍ර පුහුණුව-පැය 135 කි. ඒ අනුව මුලු පැය ගණන පැය 540කි. පහත මූලිකාංගයන්ගෙන් වෘද්ධ විද්‍යාව සහ වැඩිහිටි රැකවරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සමන්විත වේ.

- විෂය ඒකක 10
- ක්ෂේත්‍ර පුහුණුව

2021 වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත් වූ ස්ථාන

1. වැඩිහිටි මහලේකම් කාර්යාලය, බත්තරමුල්ල

2021.12.08 දින මෙම ඩිප්ලෝමා පාඨමාලාවේ අවසන් පැනල මණ්ඩලය පවත්වා අවසන් කර ඇත.

සහතිකපත්‍ර පාඨමාලා

1. විශේෂ අධ්‍යාපනය ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

හැඳින්වීම

මෙම සහතික පත්‍ර පාඨමාලාව සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබූ ඉල්ලීමකට අනුව පැවැත්වූ අතර, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවතින ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වන වෘත්තීය පුහුණු ආයතනවල වෘත්තීය උපදේශකවරුන් පදනම් කරගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය. මෙම සහතික පත්‍ර පාඨමාලාව සඳහා 2018 සහ 2019 වර්ෂවල බඳවා ගත් වෘත්තීය උපදේශකවරුන් 11 දෙනෙකු සහභාගි විය. ඔවුන් ජුකී, මැහුම්, හස්ත කර්මාන්ත, පරිගණක, ගෘහස්ත, විදුලි කාර්මික, රූපලාවන්‍ය, මෝටර් කාර්මික, ඉලෙක්ට්‍රොනික් හා ගෘහස්ත විදුලි කාර්මික යන අංශයන්හි වෘත්තීය උපදේශකවරුන් ලෙස සේවය කරනු ලබයි.

ඉලක්කය

වෘත්තීය උපදේශකවරුන් තුළ ආබාධ සහිත තරුණ තරුණියන් සමඟ වැඩ කිරීමට අවශ්‍ය වන දැනුම, කුසලතා, ආකල්ප සහ මානසික සැකැස්ම නිර්මාණය කිරීම හා තම වෘත්තීය කාර්යභාරය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීම

අරමුණු

- ගුණාත්මක බවින් පිරි වෘත්තීය උපදේශකවරුන් බිහිකිරීම
- වෘත්තීය උපදේශකවරුන් විසින් ඉගැන්වීමේදී එම කාර්යය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට අවශ්‍ය පුහුණුව ලබා දීම

මාධ්‍යය : සිංහල

කාල සීමාව : මාස 03කි.

ජායාරූප - විශේෂ අධ්‍යාපනය ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ සිසුන් මාදම්පේ සහ තෙළඹුයාය සමාජ සේවා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන් හි ක්ෂේත්‍ර කටයුතුවල නියැලීම අධීක්ෂණය





පුහුණු අංශය මගින් 2021 වර්ෂයේ පැවැත් වූ අධ්‍යයන හා පුහුණු වැඩසටහන්

1. **ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශය මගින් පවත්වන අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන**

පුහුණු අංශය මගින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා (සහතික පත්‍ර / ඩිප්ලෝමා / උසස් ඩිප්ලෝමා) සහ පුහුණු වැඩසටහන් පිළිබඳ මහජන දැනුවත්භාවය තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අරමුණින් ප්‍රදේශ කිහිපයක මෙම අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්විණි. එලෙස පවත්වන ලද වැඩසටහන් පිලිබඳ විස්තර පහත දැක්වේ.

- 2021.03.10 වන දින මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පවත්වන ලද අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

- 2021.03.23 හා24 දෙදිනපහත ස්ථානයන්හි අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.

    - හම්බන්තොට මහජන සෞඛ්‍ය කාර්යාලය
    - කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
    - හක්මන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
    - මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
    - වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
    - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

- 2021.03.31වනදිනඅතුරලිය
  දිස්ත්‍රික්ලේකම්කාර්යාලයේදීපවත්වනලදඅධ්‍යයනපාඨමාලාසහපුහුණුවැඩසටහන්
  ප්‍රවර්ධනයකිරීමේවැඩසටහන

ඡායාරූප - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිළධාරීන් හා හම්බන්තොට මහජන සෞඛ්‍ය කාර්යාලයේ නිළධාරීන් සඳහා පවත්වන ලද අධ්‍යයන පාඨමාලා සහ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන





2. පුහුණු අංශය මගින් මෙහෙය වූ කොවිඩ් - 19 දුරකථන මාර්ගික උපදේශන සේවාව

හැඳින්වීම

ශ්‍රී ලංකා සමාජය තුළ කොවිඩ් - 19 ව්‍යසන තත්ත්වය පදනම් කරගනිමින් බොහෝ කායික, මානසික මෙන්ම සමාජීය ගැටලු රැසක් මතුවිය. එහිදී උපදේශකවරුන් ආදී වෘත්තිකයින්ගේ අවශ්‍යතාව වඩාත් ඉස්මතු විය. නමුත් රට තුළ ක්‍රියාත්මක කරනු ලැබූ අගුලු දැමීම් හා සංචරණ සීමා පදනම් කර ගනිමින් ඇතැම් පුද්ගල ගැටලු සඳහා ඍජු උපදේශන මැදිහත්කරණය සිදු කිරීම අපහසු කාර්යයක් විය. එසේම කොවිඩ් - 19 ව්‍යසන තත්ත්වයට මුහුණ පා සිටින පුද්ගලයින්ට පවා අවශ්‍ය මනෝ උපදේශන මැදිහත්කරණය සිදු කිරීම මේ කාල සීමාව තුළ දැඩි අවශ්‍යතාවක් විය. ඒ තත්ත්වය පදනම් කරගෙන ගැටලු සහිත පුද්ගලයින් සඳහා උපදේශන මැදිහත්කරණය සිදු කිරීමේ අරමුණින් මෙම දුරකථන මාර්ගික උපදේශන සේවාව ආරම්භ කරන ලදි. එය මූලික වශයෙන් පළාත් පදනම් කරගනිමින් සිදු කරන ලදි. පුහුණු අංශයේ සියලුම නිළධාරීන් මේ සඳහා දායකත්වය සපයනු ලැබීය.

අරමුණ : කොවිඩ් - 19 වසංගත තත්ත්වය නිසා ගැටලු වලට මුහුණ පා සිටින පුද්ගලයින් වෙනුවෙන් උපදේශන සේවා සැපයීම

කාල සීමාව : 2021සමස්ත වර්ෂය තුළ

සේවාලාභීන් සංඛ්‍යාව : කොවිඩ් - 19 නිසා පීඩාවට පත් පුද්ගලයින් 135 දෙනෙකු සඳහා

ඡායාරූපය - කොවිඩ් - 19 දුරකථන මාර්ගික උපදේශන සේවාව පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට සකස් කරන ලද දැන්වීම



උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ ක්ෂේත්‍ර අධ්‍යාපන අත්පොත සංශෝධනය කිරීම.

හැඳින්වීම

උපදේශන විෂයය ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීමේදී උපදේශනය පිළිබඳ න්‍යායාත්මක දැනුම පමණක් නොව ඒ හා සමගාමී කුසලතා මෙන්ම ක්ෂේත්‍ර අධ්‍යාපනය ලබාදීම ද වැදගත් වේ. ඒ අරමුණින් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන් පන්ති කාමර දේශන අවසානයේ ක්ෂේත්‍ර පුහුණුව සඳහා අනුයුක්ත කරනු ලැබේ. එහිදී උපදේශනය වැනි විෘත්තිය පාඨමාලාවල තත්ත්වය පවත්වාගෙන යාමේ අරමුණින් මෙම ක්ෂේත්‍ර අධ්‍යාපන අත්පොත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිකන නිර්දේශයන්ට අනුකූල වන පරිදි (SLQF)අනුගත වෙමින් සංශෝධනය කරනු ලැබේ.

මේ දක්වා භාවිත කරනු ලැබූ ක්ෂේත්‍ර අධ්‍යාපන මැනුවලය සංශෝධනය කිරීම සඳහා 2021.05. 10 වන දින සායනික මනෝවිද්‍යාඥ රොෂාන් ධර්මපාල මෙනවියගේ ප්‍රධානත්වයෙන් එක් වැඩමුලුවක්ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල විජේසිංහ හා මහාචාර්ය වසන්තා සුභසිංහ ගේ සහභාගීත්වයෙන් 2021.12.09 දින අනෙක් වැඩමුලුව ද පවත්වන ලදි. මේ සඳහා පුහුණු අංශයේ අධ්‍යක්ෂිකා ඇතුලු සියලුම ජ්‍යෙෂ්ඨ පුහුණු කිරීමේ / පුහුණු කිරීමේ නිළධාරීන් සහභාගි විය.

අරමුණ

- උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන සිසුන්ගේ ක්ෂේත්‍ර කටයුතු වඩාත් ගුණාත්මක අන්දමින් පවත්වාගෙන යාම.

3. ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාව

හැඳින්වීම

පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් හි සිසුන් ක්ෂේත්‍ර පුහුණුව සඳහා අනුයුක්ත කරනු ලබන ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් වෙනුවෙන් මෙම වැඩසටහන් මාලාව ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව වැඩසටහන් 10ක් සිංහල හා දෙමළ යන මාධ්‍යයන් ඔස්සේ පැවැත්වීය.

අරමුණ

- ඩිප්ලෝමා / උසස් ඩිප්ලෝමා පාඨමාලාවන් හදාරන සිසුන්ගේ ක්ෂේත්‍ර අධීක්ෂණ කටයුතු සිදුකරන ක්ෂේත්‍ර අධීක්ෂකවරුන්ගේ නිපුණතා සංවර්ධනය කිරීම

ඡායාරූප - ක්ෂේත්‍ර අධීක්ෂකවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාව සඳහා සකස් කරන ලද දැන්වීම හා චිත්‍ර ප්‍රතිකාර (දමිළ මාධ්‍ය) සැසිය





4. සමාජ වැඩ පුහුණුව තුළ මූලික කුසලතා භාවිතය පිළිබඳ මාර්ගගත කෙටි කාලීන පුහුණු වැඩසටහන

හැඳින්වීම

සමාජ වැඩ පුහුණුව තුළ මූලික කුසලතා භාවිතය පිළිබඳ මාර්ගගත පුහුණු වැඩසටහන නව පත්වීම් ලද සංවර්ධන නිළධාරීන් සඳහා පවත්වනු ලැබීය. සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම මෙම වැඩසටහන පැවැත්වුනු අතර 2021 ජූලි 12වන දින සිට 2021 අගෝස්තු 09වන දින දක්වා සිහල මාධ්‍ය වැඩසටහනත්, 2021 ජූලි 13වන දින සිට 2021 අගෝස්තු 10 වන දින දක්වා දෙමළ මාධ්‍ය වැඩසටහනත් පැවැත්විණි. එහිදී සංවර්ධන නිළධාරීන් කණ්ඩායම් 04කට බෙදා වැඩසටහන කාණ්ඩ 04ක් යටතේ පවත්වන ලදි. ඒ සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නවක පත්වීම්ලාභී උපාධිධාරීන් 784 ප්‍රමාණයක් සිංහල හා දමිළ මාධ්‍යයෙන් සහභාගි විය.

අරමුණු

- තිරසාර සංවර්ධනය සඳහා ඵලදායී හා කාර්යක්ෂම සේවා සැපයීමට අවශ්‍යපරිදි සකස් කරන ලද / අභිරුචිකරණය කරන ලද පුහුණු වැඩසටහන් තුළින් සමාජ සුභසාධන සමාජ සේවයේ ක්ෂේත්‍ර මට්ටමින් සේවය කරන නිළධාරීන්ගේ නිපුණතා වර්ධනය කිරීම
- සමාජ වැඩ, උපදේශනය, සමාජ සුභසාධනය, සමාජ ප්‍රතිපත්ති සහ සමාජ සංවර්ධන යන ක්ෂේත්‍ර වල වෘත්තිකයින් සඳහා අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප අඛණ්ඩව සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැපයීම

ඉගෙනුම් ප්‍රතිඵල

මෙම පුහුණු වැඩසටහන අවසානයේදී සහභාගිවන්නන් තුළින් පහත ඉගෙනුම් ප්‍රතිඵල අපේක්ෂා කරන ලදි.

- සමාජ වැඩ පිළිබඳ සංකල්පය පැහැදිලි කිරීමට
- සමාජ වැඩ ක්‍රමවේද හඳුනා ගැනීමට
- සමාජ වැඩ දැනුම, කුසලතා සහ ආකල්ප නිර්වචනය කිරීමට
- මැදිහත්වීමේ ක්‍රියාවලියක කුසලතා වර්ධනය කිරීමට
- සහයෝගී සබඳතාවලදී සමාජ වැඩ කුසලතා භාවිත කිරීමට
- ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී වර්තමාන භාවිතයන් විශ්ලේෂණය කිරීමට

කොළඹ, ගම්පහ, කුරුණෑගල, රත්නපුරය, නුවරඑළිය, අනුරාධපුරය, බදුල්ල, අම්පාර, ගාල්ල හා කලුතර ආදී ප්‍රදේශ ආවරණය වන පරිදි මෙම වැඩසටහන මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ දින 05ක් පැවැත්විණි. මෙම වැඩසටහන සමෘද්ධි, ගෘහාශ්‍රිත, ක්ෂුද්‍රමූල, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් නීල් බණ්ඩාර හපුහින්න මහතාගේ අනුශාසකත්වයෙන්, ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ෂාමිණී අත්තනායක මහත්මියගේ හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආර්.පී.බී. තිලකසිරි මහතාගේ මගපෙන්වීම යටතේ සිදු කෙරිණ.

ඡායාරූප - සමාජ වැඩ පුහුණුව තුළ මූලික කුසලතා භාවිතය පිළිබඳ මාර්ගගත කෙටි කාලීන පුහුණු වැඩසටහනේ සමාරම්භක උත්සවය හා පුහුණු සැසියක අවස්ථා







5. වයඹ පළාත් පාසල් උපදේශන ගුරුවරුන් සඳහාවන උපදේශනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන

හැඳින්වීම

වයඹ පළාතේ පාසල් සඳහා අලුතින් පත් කරන ලද පාසල් උපදේශන ගුරුවරුන්ගේ ඉල්ලීම පරිදි වයඹ පළාත් පාසල් ගුරුවරුන් 140 ක් සඳහා උපදේශනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන පවත්වන ලදි. උපදේශන ගුරුවරුන් තුළ උපදේශනය පිළිබඳ න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික භාවිතය පිළිබඳ අවබෝධය තවදුරටත් වර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන 2021 ජූලි 29වන දින සහ 2021 අගෝස්තු 05, 12, 19සහ 26 යන දිනයන්හිදි පැවැත්විණි. මෙම වැඩසටහන සිංහල මාධ්‍යයෙන් පවත්වන ලදි.

අරමුණු

- වයඹ පළාත තුළ නවක පත්වීම් ලැබූ උපදේශන ගුරුවරුන්ගේ උපදේශනය පිළිබඳ දැනුම හා කුසලතා වර්ධනය කිරීම
- උපදේශනයේ නව විෂය ක්ෂේත්‍රයක් වශයෙන් පාසල් උපදේශන ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයඋපදේශන ගුරුවරුන් තුළ වර්ධනය කිරීම

සහභාගි වූවන්ගේ ප්‍රතිපෝෂණය

මෙම වැඩසටහනට සහභාගි වූ නවක පාසල් උපදේශන ගුරුවරුන් සඳහන් කළ පරිදි ඔවුන්ට පාසල් පද්ධතිය තුළ උපදේශන සේවාව වඩාත් ඵලදායී අයුරින් සිදු කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා මෙම වැඩසටහන මගින් ලබා ගැනීමට හැකි වී ඇත. එසේම වැඩසටහන මගින් ලත් ප්‍රායෝගික දැනුම මෙම වෘත්තිය තුළ වඩාත් සක්‍රීයව සහභාගි වීමට අභිප්‍රේරණයක් ඇති කර තිබේ.

ඡායාරූප - වයඹ පළාත් පාසල් උපදේශන ගුරුවරුන් සඳහා වන උපදේශනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහනේ සමාරම්භක උත්සවය හා පුහුණු සැසියක් අතරතුර





6. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන්ට (SLQF) සහ ප්‍රතිඵල අපේක්ෂිත උසස් අධ්‍යාපනය (Outcome based higher education) සඳහා නව විෂයමාලා සකස්කිරීම පිළිබඳ කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන

හැඳින්වීම

නූතන අධ්‍යාපන ක්‍රමවේදය තුළ ප්‍රතිඵල අපේක්ෂිත අධ්‍යාපන ක්‍රමවේදය වඩාත් ඵලදායී ක්‍රමවේදයක් ලෙස හැඳින්විය හැකිය. ඒ අනුව මෙම ක්‍රමවේදය උසස් අධ්‍යාපනය තුළ වඩාත් බහුලව භාවිත කෙරේ. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය මේ වන විට පශ්චාත් උපාධි/ උපාධි/ උසස් ඩිප්ලෝමා / ඩිප්ලෝමා සහ සහතික පත්‍ර පාඨමාලාවන්හි ඉගැන්වීම් කටයුතු සිදු කරන බැවින් ඔවුන්ගේ අධ්‍යාපන භූමිකාව යාවත් කාලීන කිරීම වැදගත් වේ. ඒ අනුව මෙම වැඩසටහන ජාතික සමාජ සංවර්ධන ආයතනයේ පුහුණු අංශයේ, සමාජ සේවා විද්‍යාලයේ හා සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ සහ ප්‍රකාශන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලදී.

අරමුණු

- ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් අලුතින් ආරම්භ කිරීමට නියමිත උපාධි පාඨමාලාවන් හි තත්ත්වය පවත්වා ගෙන යාම
- කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන් පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීම
- ඉල්ලුම මත පදනම් වූ පාඨමාලා සඳහා නව විෂයමාලා සංවර්ධනයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශයන් භාවිතය ප්‍රවර්ධනය කිරීම
- තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යයන සහ සමාජ සුබසාධන සේවා සැපයුම් පද්ධති ප්‍රවර්ධනය කිරීම

මෙලෙස වැඩසටහන් දෙකක් සැසි දෙක බැගින් පැවැත්වූ අතර, ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

සම්පත් දායකත්වය - පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සම්මානනීය මහාචාර්ය දීප්ති බණ්ඩාර

සහභාගිවූවන්ගේ ප්‍රතිපෝෂණය

ප්‍රතිඵල අපේක්ෂිත උසස් අධ්‍යාපනය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතීකන නිර්දේශ පිලිබඳ මෙතෙක් පැවති දැනුම වැඩි දියුණු කරගැනීමට මෙම වැඩසටහන හේතු වූ බව සහභාගිවූවන්ගේ අදහසයි. එසේම මෙමගින් ඉගෙනුම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට අභිප්‍රේරණයක් ඇති වූ බව ද ඔවුන්ගේ අදහසයි.

7. වෘද්ධවිද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන

හැඳින්වීම

ප්‍රජා වැඩකටයුතු වල නිරතවන රාජ්‍ය නිළධාරීන්ට ස්වකීය වෘත්තීය කාර්යයභාරය ඉටු කිරීමේදී වෘද්ධවේදය පිළිබඳ දැනුම ප්‍රයෝජනවත් වේ. ඒ අනුව වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ඉල්ලීමකට අනුව වයඹ පළාත් සමාජ සේවා නිළධාරීන් හා සංවර්ධන නිළධාරීන් 100 දෙනෙකු වෙනුවෙන් මාර්ගගත ක්‍රමවේදයට අනුව මෙම වැඩසටහන පවත්වන ලදී.

අරමුණු

- වැඩිහිටියන් සමඟ රාජකාරී කටයුතු වල නිරත වන රාජ්‍ය නිලධාරීන් තුළ වෘද්ධවිද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ දැනුම වඩාත් පුලුල් කිරීම
- සමාජ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ගේ වෘත්තීය කාර්යභාරය වඩාත් ඵලදායී ලෙස ඉටුකිරීමට මග පෙන්වීම

කාලය : 2021.10.22 සිට 2021.11.19 දක්වා (දින 05ක්)

සහභාගිවූවන්ගේ ප්‍රතිපෝෂණය

වැඩසටහනට සහභාගී වූ සමාජ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන්ට මෙම වැඩසටහන මගින් වෘද්ධවිද්‍යාව හා වැඩිහිටි රැකවරණය පිළිබඳ නව දැනුම් සම්භාරයක් ලැබුණු බවත්, එමගින් ස්වකීය වෘත්තිය වැඩකටයුතු වලදී වැඩිහිටියන්ගේ කායික, මානසික හා සමාජීය ස්වභාවයන් මැනවින් අවබෝධ කර ගැනීමට මෙමගින් ලත් දැනුම හේතු වූ බවත් ඔවුන් දැක්වීය.

8. තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන

හැඳින්වීම

නූතන ලෝකයේ තාක්ෂණික දියුණුව ලෝකයේ බොහෝ කාර්යයන් වඩාත් කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා හේතු වී ඇත. එවන් කාල වකවානුවක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහාත් වඩාත් ඵලදායී තාක්ෂණික ක්‍රමවේද හඳුන්වා දීම වැදගත් වේ. ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයනික කාර්ය මණ්ඩලය සතු තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම යාවත් කාලීන කිරීම ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට හේතු වේ. එබැවින් තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ කාර්යමණ්ඩල සංවර්ධන වැඩසටහන කැළණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය කෞෂල්‍යා යටිගම්මනගේ සම්පත් දායකත්වයෙන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්විණි.

අරමුණු

- ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉගැන්වීම් සහ පුහුණු කුසලතා වැඩිදියුණු කිරීම

මේ සඳහා වැඩමුළු දෙකක් පවත්වනු ලැබූ අතර, ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

දිනය	වේලාව	මාතෘකාව	සහභාගීත්වය
24.08.2021	පෙ.ව. 9.00 - මධ්‍යහන 12.00	මාර්ගගත ඉගැන්වීම් සහ පුහුණු වැඩසටහන් සඳහා Zoom යෙදුම භාවිතා කිරීම	26
31.08.2021	ප.ව. 2.00 - ප.ව.5.00	ඉගැන්වීමේදී තාක්ෂණික මෙවලම් භාවිතය	24

අපේක්ෂිත ඉගෙනුම් ප්‍රතිඵල

මෙහිදී පහත සඳහන් ඉගෙනුම් ප්‍රතිඵල මත පදනම්ව වැඩසටහන පවත්වන ලදී.

- විවිධ ඉගැන්වීම් ක්‍රම හඳුනාගැනීම
- අධ්‍යාපනය පැහැදිලි කිරීම
- නූතන ඉගෙනුම ලබන්නෙකුගේ ලක්ෂණ නිර්වචනය කිරීම
- ඉගැන්වීමේ ක්‍රියාවලියට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙවලම් යෙදීම
- මිශ්‍ර ඉගෙනුම් ප්‍රවේශයක් යෙදීම සහ පශ්චාත් වසංගත යුගයේ සුදුසු ඉගැන්වීම් ක්‍රමයක් භාවිතා කිරීම.

සහභාගි වූවන්ගේ ප්‍රතිපෝෂණය

කොවිඩ් - 19 වසංගතය අතරතුර ඔවුන්ගේ ඉගැන්වීම් කටයුතු අඛණ්ඩව කරගෙන යාමට මෙම වැඩසටහන ප්‍රයෝජනවත් වූ බව සහභාගී වූවන් පැහැදිලි කළහ. ඉගැන්වීම් කටයුතු සඳහා තාක්ෂණය වඩාත් ඵලදායී ලෙස භාවිත කළ හැකි බව අවබෝධ කර ගැනීමටත්, පවතින තාක්ෂණික දැනුම තවදුරටත් පුළුල් කර ගැනීමටත් මෙම වැඩසටහන මඟින් සහභාගිවූවන්ට හැකි වූ බව තවදුරටත් පැහැදිලි විය.

9. පර්යේෂණ යෝජනාවලි සකස් කිරීම පිළිබඳ වැඩමුලුව

හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනය අධ්‍යයනික වැඩසටහන් පමණක් නොව පර්යේෂණ ක්ෂේත්‍රය තුළ පවා වඩාත් කාර්යක්ෂම නිතර වේ. එහිදී කාලීන වශයෙන් ශ්‍රී ලාංකීය සමාජය තුළ මතුවන විවිධ සමාජ ගැටලු පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සමාජ සංවර්ධන ප්‍රතිපත්ති, පර්යේෂණ සහ ප්‍රකාශන අංශයේ ප්‍රධානත්වයෙන් සිදු කරයි. එහිදී පර්යේෂණයක් සිදු කිරීමේ මූලික අධියර අතුරින් එකක් වන පර්යේෂණයෝජනාවක් සකස් කිරීම පිළිබඳ දැනුම අධ්‍යයන කාර්ය මණ්ඩලයට වැදගත් වේ. එපමණක් නොව අධ්‍යයන කාර්යය මණ්ඩලයේ අධ්‍යයනික අවශ්‍යතා පදනම් කර ගනිමින් දියත් කරන පර්යේෂණ සඳහා ද මෙමගින් දැනුම සපයයි.

අරමුණු

- පර්යේෂණ යෝජනාවක් වඩාත් ඵලදායී ලෙස නිර්මාණය කරන්නේ කෙසේ ද යන්න සාකච්ඡා කිරීම.
- ප්‍රධාන අරමුණ යටතේ පර්යේෂණයක් සහ පර්යේෂණ යෝජනාවක් අතර වෙනස හඳුනා ගැනීම.
- පර්යේෂණ යෝජනාවලයක මූලිකාංග හඳුනා ගැනීම.

මෙම වැඩසටහනේ දී ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා දෙකක් සමාලෝචනය කරන ලදී. මෙම වැඩසටහන ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අංශ තුනේම සහභාගිවන්නන් සමඟ අන්තර්ක්‍රියාකාරී ක්‍රමය භාවිතා කරමින් පවත්වන ලද අතර එහිදී සහභාගිවන්නන්ගේ පර්යේෂණ දැනුම සහ අත්දැකීම් වඩාත් ඵලදායී ලෙස බෙදා ගන්නා ලදී. පර්යේෂණ යෝජනාවක අධ්‍යයනයේ ප්‍රතිඵල සඳහන් කළ යුතු ආකාරය සහ එහි දී සලකා බැලිය යුතු දේ ද එහි සාකච්ඡා කෙරිණි. මීළඟ අවධානය යොමු වූයේ පර්යේෂණයක ශක්තීන් සහ දුර්වලතා මැනීම කෙරෙහි වන අතර එහිදී පර්යේෂණ මාතෘකාවක් සකස් කිරීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතු ආකාරය පැහැදිලි කරන ලදී. අවසාන වශයෙන් ආයතනය විසින් ඉදිරිපත්

කරන ලද පර්යේෂණ යෝජනා කිහිපයක ධනාත්මක අංශ මෙන්ම වෙනස් කළ යුතු කරුණු පිළිබඳව තවදුරටත් සලකා බලන ලදී.

සහභාගිවූවන්ගේ ප්‍රතිපෝෂණය

මෙම වැඩසටහන සඳහා ජාතික සමාජ සංවර්ධන ආයතනයේ අධ්‍යයනික කාර්යමණ්ඩලයේ සාමාජිකයින් 23 දෙනෙකු සහභාගි විය. සමස්ත වැඩසටහන පුරාවටම සම්පත් දායකයාගේ පර්යේෂණ දැනුම සහ අත්දැකීම් බෙදාහදා ගන්නා බැවින් වැඩසටහන වඩාත් ප්‍රායෝගික බව සහභාගිවන්නන්ගේ අදහස විය. දැනට පවතින පර්යේෂණ දැනුම තවදුරටත් වර්ධනය කර ගත හැකි බවත් ප්‍රශ්න ඇසීමෙන් මෙතෙක් පැවති ගැටලු පැහැදිලිව විසඳාගත හැකි බවත් ඔවුන් වැඩිදුරටත් ප්‍රකාශ කළා.

10. පුහුණුව හා සංවර්ධනය, සමාජ වැඩ පර්යේෂණ හා ප්‍රතිපත්ති පිළිබඳ වැඩමුලුව

හැඳින්වීම

මෙම වැඩමුළුව දින දෙකක් පුරා පැවැත්වීමට නියමිත අතර මේ වැඩමුළුවේ දෙවන දිනයයි. මෙම වැඩමුළුවේ සමස්ත අරමුණු වන්නේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ වෘත්තීය සංවර්ධනය සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉගැන්වීම්, පුහුණුවීම්, පර්යේෂණ ආශ්‍රිත වෘත්තීය ක්‍රියාකාරකම් යන සෑම අංශයකම සමාජ වැඩ, උපදේශන, සමාජ සංවර්ධනයට අදාළ දැනුම, කුසලතා, සාරධර්ම සහ ආචාර ධර්ම භාවිතය පෝෂණය කිරීමයි. සමාජ වෙනසක් සඳහා නායකත්වය වගා කිරීමට සහ සමාජ සුබසාධන සේවා බෙදාහැරීමේ පද්ධති තුළ. අද වැඩසටහන මූලික වශයෙන් පර්යේෂණ, ප්‍රතිපත්ති සහ ප්‍රකාශනය මත පවත්වන ලදී.

සම්පත් දායකත්වය - ආචාර්ය පැමිලා ඩී.එම්. පීරිස්

දිනය	කාලය	මාතෘකාව	සහභාගීත්වය
14.10.2021	පෙ.ව. 9.00 - ප.ව. 4.00	පුහුණුව හා සංවර්ධනය	28
11.11.2021	පෙ.ව. 9.00 - ප.ව. 4.00	සමාජ වැඩ පර්යේෂණ හා ප්‍රතිපත්ති	20

සහභාගි වූවන්ගේ ප්‍රතිපෝෂණය

මූලික වශයෙන් මෙම වැඩසටහන සහභාගි වූවන්ගේ සමාජ වැඩ පිළිබඳ අවබෝධය සහ පද්ධති න්‍යාය පිළිබඳ අවබෝධය පුළුල් කිරීමට සමත් වී ඇත. මෙම වැඩමුළුවට සහභාගි වූවන්ට ජාතික සමාජ සංවර්ධන ආයතන පනත පිළිබඳ දැනුම යාවත්කාලීන කිරීමට හැකි විකර ගැනීමට හැකිවූ බව ද වැඩිදුරටත් සඳහන් කර ඇත.

11. සෞභාග්‍යා සතිය වෙනුවෙන් ජාතික සමාජ සංවර්ධන ආයතනයේ ප්‍රහුණු අංශය සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලද මාර්ගගත වැඩසටහන්

ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් සෞභාග්‍යා සතිය පදනම් කරගනිමින් සැප්තැම්බර් මස 23 සිට 30 දක්වා ප්‍රාදේශීය මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් පහත වැඩසටහන් මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කරන ලදි.

වැඩසටහන	සංවිධානය	දිනය	සහභාගීත්වය
කොවිඩ් - 19 වසංගත සමයේදී පෙර පාසල් වැඩකටයුතු පවත්වාගෙන යාම සඳහා ගුරුවරුන් සවිබල ගැන්වීමේ වැඩසටහන	තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අනුරාධපුරය	2021.09.26	පෙර පාසල් ගුරුවරුන්86
කොවිඩ් - 19 වසංගත සමයේදී පෙර පාසල් දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් දෙමව්පියන් කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	තලාව ප්‍රාදේශීය මධ්‍යස්ථානය, අනුරාධපුරය	2021.09.24	දෙමාපියන් 186
කොවිඩ් - 19 වසංගත තත්ත්වය යටතේ ප්‍රජා සමාජ සංවර්ධන අභියෝග ජය ගැනීම සම්බන්ධ වැඩමුලුව - සමාජ වැඩ වෘත්තිකයින් හා ප්‍රජා වැඩකරුවන් සඳහා	අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය	2021.09.26	සමාජ වැඩකරුවන් 67
“වෘත්තීය දැවීයාම”(burnout) අවම කිරීමේ මනෝවිද්‍යාත්මක හා සෞන්දර්යාත්මක මැදිහත්වීම - කොවිඩ් ඉදිරිපෙල සේවා සපයන වෘත්තිකයින් සඳහා	අම්පාර ප්‍රාදේශීය මධ්‍යස්ථානය	2021.09.30	සෞඛ්‍ය හා උපදේශන නිළධාරීන් 187
පෙර පාසල් ගුරුවරුන් සඳහා මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම පිළිබඳ වැඩමුලුව	කිලිනොච්චි ප්‍රාදේශීය මධ්‍යස්ථානය	2021.09.23 2021.09.27 2021.09.29	පෙර පාසල් ගුරුවරුන් 45
යෞවනයින් සඳහා ක්ලමථ කළමණාකරණය	රන්න ප්‍රාදේශීය මධ්‍යස්ථානය	2021.09.29	තරුණ සංවර්ධන නිළදාරීන් 30

ඡායාරූප - කිලිනොච්චිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය පදනම් කරගනිමින් සිදු කරන ලද වැඩමුලු





12. මධ්‍යම පළාත් පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිවාස හා සංවර්ධන නිළධාරීන් සඳහා පැවැත්වූ නව යොවුන්වියේ දරුවන් සමඟ වැඩ කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන

හැඳින්වීම

මධ්‍යම පළාත් පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීමකට අනුව මධ්‍යම පළාත් පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිවාස හා සංවර්ධන නිළධාරීන් සඳහා2021 ඔක්තෝබර් 15 සිට 2021 ඔක්තෝබර් 26 දක්වා නව යොවුන් වියේ දරුවන් සමඟ වැඩ කිරීම පිලිබඳ වූ සයදින පුහුණු වැඩසටහන පවත්වන ලදි. මේ සඳහා පරිවාස හා සංවර්ධන නිළධාරීන් 69 ක් සහභාගි විය.

අරමුණු

- මධ්‍යම පළාත් පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිවාස හා සංවර්ධන නිළධාරීන්ට නව යොවුන් වියේ දරුවන් සමඟ වැඩ කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා සංවර්ධනය
- පරිවාස හා සංවර්ධන නිළධාරීන්ට නව යොවුන් වියේ දරුවන් සමඟ වැඩ කිරීමේදී මතුවන ගැටලු අවම කර ගත හැකි ආකාරය ප්‍රගුණ කිරීම

සහභාගි වූවන්ගේ ප්‍රතිපෝෂණය

මධ්‍යම පළාත් පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුවේ පරිවාස හා සංවර්ධන නිළධාරීන් විසින් දක්වා සිටි පරිදි මෙම පුහුණු වැඩසටහන ඔවුන්ගේ වෘත්තීය ජීවිතය වඩාත් ඵලදායි අයුරින් පවත්වාගෙන යාමටත් වෘත්තීය වපසරිය තුළ මතුවන දෛනික ගැටලු විසඳා ගැනීමටත් ප්‍රයෝජනවත් වී ඇත.

13. කන්‍යා සොයුරියන් සඳහා වූ නායකත්වය සහ උපදේශනය පිළිබඳ කෙටිකාලීන පුහුණු වැඩසටහන

හැඳින්වීම

ශුද්ධ වූ පවුලේ කන්‍යා සොයුරියන් මේ වනවිට ප්‍රජා සේවාවන් රැසක නිරත වේ. ඒ අතර පාසල් පද්ධතිය තුළ මෙන්ම ප්‍රජා මට්ටම තුළද ඔවුන් සේවය කරනු ලබයි. ඒ අනුව ඔවුන්ගේ භූමිකාව තුළ ප්‍රජා නායකත්වය මෙන්ම උපදේශනය පිළිබඳ අවබෝධය ද ස්වකීය වෘත්තීය කාර්යභාරය වඩාත් ඵලදායී අයුරින් ඉටු කිරීමට වැදගත් වේ. ඒ අනුව ශුද්ධ වූ පවුලේ කන්‍යා සොයුරියන්ගෙන් ලද ඉල්ලීමකට අනුව ඉහත කෙටි කාලීන පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි.

අරමුණු

- ප්‍රජා මට්ටමේ සේවය කරන කන්‍යා සොයුරියන්ගේ නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම තුළින් ඔවුන්ගේ වෘත්තීය කාර්යභාරය වඩාත් ඵලදායී කිරීම
- කන්‍යා සොයුරියන් තුළ උපදේශනය පිළිබඳ දැනුවත්භාවයක් ඇති කිරීම

මෙම වැඩසටහන 2021 නොවැම්බර් 01 වනදා සිට 2021 නොවැම්බර් 19 දක්වා දින 10ක් පැවැත්විය. මේ සඳහා ශුද්ධ වූ පවුලේ කන්‍යා සොයුරියන් 57 දෙනෙකු සහභාගි විය.

සහභාගි වූවන්ගේ ප්‍රතිපෝෂණය

මෙම වැඩසටහන ඔවුන්ගේ වෘත්තීය කාර්යභාරය වඩාත් ඵලදායී අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රයෝජනවත් වූ බවත්, උපදේශන ක්ෂේත්‍රය පිළිබඳ නව දැනුමක් ඔවුන් තුළ මෙම වැඩසටහන මගින් ස්ථාපනය වූ බවත් ඔවුන්ගේ අදහසයි.

14. සමෘද්ධි නිළධාරීන් වෙනුවෙන් පවත්වන ලද උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවය

ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබූ ඉල්ලීමකට අනුව දීප ව්‍යාප්තව සේවය කරන සමෘද්ධි නිළධාරීන් 153ක් වෙනුවෙන් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව කොළඹ, රන්න හා තලාව යන මධ්‍යස්ථානයන් හි සිංහල මාධ්‍යයෙන් ද කිලිනොච්චි මධ්‍යස්ථානයේ දෙමළ මාධ්‍යයෙන් ද උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා 04 ක් පවත්වන ලදි. එය 2018 වර්ෂයේ ආරම්භ වූ අතර, 2019 වර්ෂයේ අවසන් කරන ලදි. මෙම ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව අවසන් කරන ලද සමෘද්ධි නිළධාරීන් 124 මෙම ඩිප්ලෝමා ප්‍රධානෝත්සවයේදී සහතික පත්‍ර ලබා ගන්නා ලදි. මෙම උත්සවය 2021 නොවැම්බර් 17 දින ප්‍රධානත්වයෙන් ගරුසමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ සෙත්සිරිපාය සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදි.

ඡායාරූප - සමෘද්ධි නිළධාරීන් වෙනුවෙන් පවත්වන ලද උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ සහතික පත්‍ර ප්‍රදානෝත්සවයේ සුවිශේෂී අවස්ථා කිහිපයක්







15. පාසල් සිසුන් සඳහා වූ කෙටිකාලීන පුහුණු වැඩසටහන

හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ රන්න ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය විසින් 2021 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී වැඩ සැලැස්මට අනුව සහ ලෝක ළමා දින සතිය මුල් කරගනිමින් ***"සියල්ලටම ප්‍රථම දරුවන්"***ජාතික තේමාවට සමගාමීව, හම්බන්තොට ධර්මපාල විද්‍යාලය හා ඒකාබද්ධව හම්බන්තොට ධර්මපාල විද්‍යාලය හා ඒකාබද්ධව එහි සිසුන් සඳහා අභියෝග ජයගනිමින් විභාගය සඳහා මනෝවිද්‍යාත්මකව සංවිධානය වන ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් වශයෙන් මෙය සිදු කරන ලදි.

සාකච්ජා කරන ලද මාතෘකාව - අභියෝග ජයගනිමින් විභාගයට සූදානම් වන්නේ කෙසේද ?

සහභාගි වූවන්ගේ ස්වභාවය - ධර්මපාල මහා විද්‍යාලයේ සිසු දරු දැරිවියන් 60 දෙනෙකු සහභාගි විය.

ඉල්ලීම් කරන ලද ආයතනය - ධර්මපාල මහා විද්‍යාලය, හම්බන්තොට

දේශන මාතෘකා - අභියෝග ජයගෙන සාර්ථකව විභාගයට මුහුණ දීම

සහභාගි වූවන්ගේ ප්‍රතිපෝෂණය

උක්ත වැඩසටහන පිළිබඳ පිළිබඳ යහපත් ප්‍රතිචාර ලැබුණු අතර, පාසල් සිසු දරුවන්ගේ අදහස වූයේ තමන්ගේ ඉදිරි අධ්‍යාපන ඉලක්ක ජය ගැනීම සඳහා තමන්ට මෙම වැඩසටහන මගින් ලැබුණු දැනුම බොහෝ සෙයින් වැදගත් වූ බවයි. එමෙන්ම මේ සඳහා සහභාගි වූ ගුරු මණ්ඩලයේ අදහස වූයේ පාසලේ අනෙකුත් දරුවන් විෂයෙහි ද මෙය අත්‍යවශ්‍ය වැඩසටහනක් බැවින් මෙවැනි වැඩසටහනක් නැවත පැවැත්වීම සුදුසු බවයි.

16. ක්ලමථ කළමණාකරණය හා ආකල්ප සංවර්ධන කෙටිකාලීන දෙදින පුහුණු වැඩසටහන

හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ රන්න ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය විසින් 2021 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී වැඩ සැලැස්මට අනුව සිදුකළ යුතු වැඩසටහන් අතුරින් එක් වැඩසටහනක් වශයෙන් උක්ත වැඩසටහන 'සෞභාග්‍යා' සතියට සමගාමීව, ජාතික තරුණ සේවා සභාවේ හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය හා ඒකාබද්ධව සංවිධානය කරන ලදි.

සහභාගි වූවන්ගේ ස්වභාවය - ජාතික තරුණ සේවා සභාවට අනුයුතක්තව සේවය කරන තරුණ සංවර්ධන නිළදාරීන් 30 දෙනෙකු සහභාගි විය.

පැවැත්වූ දිනය - 2021.09.29

ඉල්ලීම් කරන ලද ආයතනය - ජාතික තරුණ සේවා සභාව, හම්බන්තොට

සහභාගි වූ ආයතන - යායවත්ත තරුණ සේවා ඒකකය, එරමිණියාය තරුණ සේවා ඒකකය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල

දේශන මාතෘකා - ක්ලමථය හඳුනා ගැනීම, ක්ලමථ කළමණාකරණය, ආකල්ප සංවර්ධනය, වෘත්තීය මාර්ගෝපදේශය හා රැකියා උපදේශනය

පුහුණු ක්‍රමවේදය - මාර්ගස්ථ දේශන, කණ්ඩායම් සාකච්ඡා, සංයම අභ්‍යාස හා වීඩියෝ දර්ශන

සහභාගිවූවන්ගේ ඇගයීම්, නිගමන හා නිර්දේශ -

උක්ත වැඩසටහන පිළිබඳ යහපත් ප්‍රතිචාර ලැබුණු අතර ඔවුන්ට තම වෘත්තීය ජීවිතයේ අභියෝග ජය ගැනීමටත්, තරුණ ප්‍රජාවේ සංවර්ධනය විෂයයෙහි මැදිහත්වීමේදී මෙම සැසි තුළින් ප්‍රායෝගිකව ලැබුණු දැනුම බොහෝ සෙයින් වැදගත් වූ බව පවසා සිටින ලදි. එමෙන්ම තවදුරටත් සිය නිළධාරීන් සඳහා වූ මෙම වැඩසටහන් හි අවශ්‍යතාව ඇති බවත්, තරුණ ප්‍රජාව මූලික කොටගනිමින් මෙවැනි වැඩසටහන් සංවිධානය කිරීම සිදු කළ යුතු බවත් ඔවුන්ගේ අදහස විය.

17. අධිකරණ සේවා කොමිෂන් සභාව (JSC) යටතේ අධිකරණ අමාත්‍යාංශයට (MoJ) අනුබද්ධ අධිකරණ පවුල් උපදේශකවරුන් සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම

හැඳින්වීම

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද අධිකරණ පවුල් උපදේශකයින්ගේ ධාරිතාව ඉහළ නැංවීමේ අරමුණින් අධිකරණ සේවා කොමිෂන් සභාව (JSC) විසින් පත් කරන ලද පවුල් අධිකරණ උපදේශකවරුන් සඳහා සේවා පුහුණු වැඩසටහනක් ලෙස මෙම පුහුණු වැඩසටහන සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය අධියර දෙකකින් සමන්විත වේ. එනම්,

1. **පළමු අදියර :** විෂය මාලාවක් සකස් කිරීම සහ එය පුහුණු අත්පොතක් ලෙස මුද්‍රණය කිරීම.
2. **දෙවනඅදියර :** සංවර්ධිත විෂයමාලාව මත පදනම්ව පවුල් අධිකරණ උපදේශකවරුන් සඳහා පුහුණුව පැවැත්වීම.

පළමු අදියර අධිකරණ සේවා කොමිෂන් සභාව, ජාතික සමාජ සංවර්ධන ආයතනය සහ ආසියා පදනම අතර සහයෝගිතා මූලපිරීමක් ලෙස 2020 මැයි සිට 2020 දෙසැම්බර් දක්වා සිදු කරන ලදී. විෂය විශේෂඥවරුන්ගේ දායකත්වයෙන් විෂය මාලාවක් සකස් කර ඇති අතර පුහුණු අත්පොතක් ලෙස විෂය මාලාවේ මුද්‍රිත පිටපතක් ලබා දීමට කටයුතු කර ඇත.දෙවන අදියර වූයේ සකස් කරන ලද විෂයමාලාව මත පදනම්ව සකස් කරන ලද පුහුණු වැඩසටහන පැවැත්වීමයි. මෙම වැඩසටහන එක්දින පුහුණු වැඩසටහන් හතරක් ලෙස පවත්වන ලදී.

ව්‍යාපෘතියේ අරමුණු

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන පරමාර්ථය වූයේ විවාහ ගැටුම් හෝ සුහද වෙන්වීමකදී සම්බන්ධතා නැවත ඇති කිරීම සඳහා පවුල් උපදේශනයේ නිරතෙවන අධිකරණ පවුල් උපදේශකයින්ගේකුසලතා සංවර්ධනය කිරීමයි.

ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන

සමාජ වැඩ පුහුණු, පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය, රන්න

2021වර්ෂයට අදාල ප්‍රගති වාර්තාව



1. හැඳින්වීම

දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් 2014.11.05 වන දින ශ්‍රී ආනන්ද හිමි පෙදෙස,අඩි 100 පාර,රන්න යන ලිපිනයෙහි ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජවැඩ පුහුණු,පර්යේෂණ හා ක්ෂේත්‍ර ඉගෙනුම් ප්‍රාදේශීය මධ්‍යස්ථානය ආරම්භ කරන ලදි .

මධ්‍යස්ථානයට ගොඩනැගිලි 02 අයත්වන අතර එහි පංති කාමර දේශනශාලා (සිසුන් 50) 02ක්,නේවාසික පහසුකම් ලබාගැනීම සඳහා කාමර 02ක්(ඇඳන්04),කාර්යාල කාමරයක් සහ කුඩා පුස්තකාලයකින් සමන්විත වේ.

2. 2021 වර්ෂයේ රන්න මධ්‍යස්ථානයේ ආදායම් හා වියදම් වාර්තාව

- **මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු සඳහා වියදම්**

අනු අංකය	විස්තරය	මුදල(රු.)
01.	විදුලි බිල්පත්	13,805.10
02.	ජල බිල්පත්	9,563.76
03.	පරිපාලන වියදම්	19,440.00
	මුළු වියදම	**42,808.86**

- **මධ්‍යස්ථානයේ ආදායම් වාර්තාව**

අනු අංකය	විස්තරය	මුදල (රු.)
01.	අභ්‍යන්තර නිළධාරින් /දේශකවරුන් සඳහා නේවාසික පහසුකම් සැපයීම මඟින්	600.00
02.	පාඨමාලා/වැඩමුළු පැවැත්වීම මඟින්	4000.00
	එකතුව	4600.00

සැ.යු.- ඉහත දක්වන ලද අගයන් ලබාදෙන ලද සේවයේ අගය දැක්වීමක් පමණි.

2021 වර්ෂයේ රටතුළ පැවති කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් සෞඛ්‍ය ආරක්ෂිත උපදෙස් පරිදි කටයුතු කිරීමට සිදුවූ බැවින් සැලසුම් කල පරිදි වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

- **රන්න මධ්‍යස්ථානයේ 2021 වර්ෂයේ පවත්වන ලද වැඩසටහන් විස්තර**

අනු අංකය	වැඩසටහනේ නම	දිනය
01.	සමාජවැඩ උපාධි පාඨමාලාව සඳහා ඇතුලත් වීමේ පරීක්ෂණය පැවැත්වීම	2021.02.18
02.	සමාජවැඩ උපාධි පාඨමාලාවේ දෙවන වසර සිසුන්ගේ පළමු සාමාසික විභාගය පැවැත්වීම	2021.02.22
03.	සමාජවැඩ උපාධි පාඨමාලාවේ දෙවන වසර සිසුන්ගේ පළමු සාමාසික විභාගය පැවැත්වීම	2021.02.23
04.	සමාජවැඩ උපාධි පාඨමාලාවේ දෙවන වසර සිසුන්ගේ පළමු සාමාසික විභාගය පැවැත්වීම	2021.02.24
05.	සමාජවැඩ උපාධි පාඨමාලාවේ දෙවන වසර සිසුන්ගේ පළමු සාමාසික විභාගය පැවැත්වීම	2021.02.25
06	සමාජවැඩ උපාධි පාඨමාලාවේ දෙවන වසර සිසුන්ගේ පළමු සාමාසික විභාගය පැවැත්වීම	2021.02.26
07.	සමාජවැඩ උපාධි පාඨමාලාවේ දෙවන වසර සිසුන්ගේ පළමු සාමාසික විභාගය පැවැත්වීම	2021.02.27
08.	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම	2021.03.25
09.	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම	2021.09.05
10.	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම	2021.09.27
11.	ක්ලමථ කළමනාකරණය හා ආකල්ප සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන	2021.09.29
12.	ක්ලමථ කළමනාකරණය හා ආකල්ප සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පුහුණු වැඩසටහන	2021.09.30
13.	පාසල් ළමුන් සඳහා වූ කෙටි කාලීන වැඩසටහන	2021.10.04
14.	උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම	2021.10.07

ප්‍රාදේශීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය, තලාව

2021 වර්ෂයට අදාල ප්‍රගති වාර්තාව



1. හැඳින්වීම

ජාතික සමාජ සංවර්ධන ආයතනයේ තලාව ප්‍රාදේශිය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තලාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, මොරගොඩ ග්‍රාමසේවා කොට්ඨාශයේ පිහිටා ඇත. අනුරාධපුර කුරුණෑගලප්‍රධාන මාර්ගයට මුහුණලා තලාව නගරයේ සිට කි.මී. 2 පමණ අනුරාධපුර නගරයට වන්නට පිහිටා ඇත.

වර්තමානය වන විට තලාව ප්‍රාදේශිය පුහුණු කිරීමේ මධ්‍යස්ථානය සතුව අක්කර 05 ආසන්න භූමියක් සතුවන අතර දෙමහල් ගොඩනැගිල්ලකින් සමන්විත වේ. ප්‍රධාන ගොඩනැගිල්ලේ පහල මහලේ කාර්යාල කාමර 02 ක් හා කුඩා නේවාසික කාමර 02ක් තට්ටු ඇදන් 35 සහිත වෙන් කරන ලද කාමර 02 කින් හා භොජනාගාරයකින් සමන්විත වේ. ඉහළ මහලේ කුඩා නේවාසික කාමර 02ක් හා VIP කාමර 01 දේශන ශාලාවකින් යුක්ත වේ.

2. ආරම්භය

අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා සමාජ සේවා අමාත්‍ය ගරු බර්ටි ප්‍රේමලාල් දිසානායක මැතිතුමන්ගේ යෝජනාවක් අනුව බණ්ඩාරනායක ජාතික සමාජ සංවර්ධන ආයතනය සඳහා වන මෙම ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු එතුමාගේ ආරාධනයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ගරු කථානායක ආචාර්ය කේ.බී. රත්නායක මැතිතුමගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරණායක කුමාරතුංග මැතිනිය විසින් වර්ෂ 1999 ක් වූ පෙබරවාරි මස 26 වෙනි දිනට යෙදුන සුභමොහොතින් මුල්ගල තබා ආරම්භ කරන ලදී.

3. ආරම්භ කිරීමේ අරමුණු

2002 මාර්තු මස 31 වන දින සමාජ සුභසාධන අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා අතින් විවෘත කරන ලදී. මෙම තලාව මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ වුයේ සමාජවැඩ අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණ අංශයෙහි වැඩ මෙම මධ්‍යස්ථානය හරහා ප්‍රදේශයට ලබාදීම සඳහාත් සියලුම දෙනාගේ ජීවන තත්ත්වය ගුණාත්මක මට්ටමින් වර්ධනය කිරීමෙහිලාත් ප්‍රදේශීය මට්ටමින් සහය ලබාදීම සඳහාත් ය.

